# ජපන් භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

(2015 සිට ක්‍රියාත්මක වේ)

# 10 ශ්‍රේණිය



සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්වි භාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# ජපන් භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 10 ශ්‍රේණිය

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

*වෙබ් අඩවිය www.nie.lk*

*විද්‍යුත් තැපැල :info@nie.lk*

ජපන් භාෂාව

ගුරු මාර්ගෝපදේශය

10 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

*www.nie.lk*

*info@nie.lk*

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වු අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වු කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

2015 වර්ෂයේ විෂයමාලා ප්‍රතිසංවිධානය යටතේ විදේශ හා සම්භාව්‍ය භාෂා සඳහා ගුරු මාර්ගෝපදේශ හඳුන්වාදීමට ලැබීම ඉතා සතුටට කරුණකි. වර්තමානයේ දී, ජාත්‍යන්තරය සහ ගෝලීයකරණය තුළ විදේශ භාෂා සඳහා හිමි වන්නේ සුවිශේෂ වැදගත් කමකි. විවිධ සමාජ මට්ටම් තුළ විවිධ භාෂාවල භාවිතය, ඉතා සීමිත භාෂා කිහිපයක පවත්නා භාෂාත්මක අධිරාජ්‍යවාදය මුලිනුපුටා දමයි.

වර්තමානයේ දී, ශ්‍රී ලාංකිකයන් තුළ භාෂා ඉගෙන ගැනීම සඳහා ඉතා විශාල ඉල්ලුමක් සහ උනන්දුවක් පවතියි. 2015 වර්ෂයේ දී චීන, රුසියන් සහ කොරියන් යන භාෂා ද සාමාන්‍ය පෙළ විෂයමාලාවට ඇතුළත් වී ඇති හෙයින් ශිෂ්‍යයන්ට ජපන්, ජර්මන්, ප්‍රංශ, හින්දී, පාලි, සංස්කෘත සහ අරාබි යන විෂයයන්ට අමතර ව ඉහත භාෂා ද හැදෑරීමේ අවස්ථාව උදාවනු ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශයේ සඳහන් එක් එක් නිපුණතාවන් අත්පත් කර ගැනීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ ව ගුරුවරයාට මග පෙන්වීමක් කර ඇත. ඒ අනුව විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් අනුව වඩා හොඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීමේ නිදහස ගුරුවරයාට හිමි වේ.

මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා දායකත්වය ලබාදුන් බාහිර සම්පත් පුද්ගල කණ්ඩායමට ද මෙම පොත සකස් කිරීමේ වගකීම දැරූ ව්‍යාපෘති නායක සහ ඒ සඳහා සහාය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තුතිය හිමි වේ.

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය**

# විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය හා අනුමැතිය | - | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය. |
| විෂය විශේෂඥ උපදේශනය | - | ජුන් අරයි<br>ජපන් භාෂා විශේෂඥ |
| විෂය සම්බන්ධීකරණය | - | මධුභාෂිණී දෙල්දෙණිය<br>සහකාර කථිකාචාර්ය,<br>සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්වි භාෂා අධ්‍යාපන<br>දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| ලේඛක මණ්ඩලය | - | |
| අභ්‍යන්තර | | මධුභාෂිණී දෙල්දෙණිය<br>ශාස්ත්‍රවේදී (ගෞරව)<br>ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| බාහිර | | සඳමාලි ගුණවර්ධන<br>ශාස්ත්‍රවේදී (ගෞරව)<br>සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, කොළඹ 07<br><br>වත්සලා ද සිල්වා<br>ශාස්ත්‍රවේදී (ගෞරව)<br>උසස් බාලිකා විද්‍යාලය, ගල්කිස්ස<br><br>ජුන් අරයි<br>ශාස්ත්‍රපති<br>ජපන් භාෂා විශේෂඥ /බාහිර කථිකාචාර්ය<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| විෂය සංස්කරණය | - | ආචාර්ය දිල්රුක්ෂි රත්නායක<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>නූතන භාෂා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| පරිගණක වදන් සැකසුම | - | ශිරානි සමරක්කොඩි<br>දනූෂි විතාන |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

2007 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ කනිෂ්ඨ හා ද්විතීයික ශ්‍රේණි සඳහා නිපුණතා පාදක විෂය මාලාවක් හඳුන්වා දී තිබේ. ඒ අනුව 2009 වසරේ දී ජපන් භාෂාව 12, 13 ශ්‍රේණි සඳහා නිපුණතා පාදක නව විෂය නිර්දේශයක් හඳුන්වා දී ඇත. නිපුණතාවක් යනු දැනුම, ආකල්ප, කුසලතා, පුද්ගල හා සමාජ හැකියා යන සියල්ලේ ම එකතුවකි. නිපුණතාවක් අත්පත්කර ගැනීම යනු යම් කාර්යයක නිරතවීමේ දී හෝ ඉගෙනීමේ දී තමා විසින් ලබා ඇති දැනුම, ආකල්ප, කුසලතා සහ හැකියාවන් භාවිතයට ගැනීමේ ශක්තියයි. නිපුණතාවක් ලබා ගැනීම සඳහා හැදෑරිය යුතු විෂය සන්ධාරය සහ එක් එක් වාරයට වෙන් කර ඇති කාල පරිච්ඡේද සංඛ්‍යාව ද සැලකිල්ලට ගෙන නිපුණතා මට්ටම් කිහිපයක් දක්වා ඇත. එක් එක් නිපුණතා මට්ටමකට ළඟා වීම සඳහා ශිෂ්‍යයකු විසින් අත්පත් කර ගනු ලබන සුවිශේෂ දැනුම ඉගෙනුම් පල යටතේ සඳහන් කර ඇත. ඉගෙනුම් පලයක් යනු පාඩම් ඒකකයක් අවසන් කළ පසු ශිෂ්‍යයා විසින් සාධනය කර ගනු ඇතැයි අපේක්ෂිත තත්වයයි. ශිෂ්‍යයාගේ සාධනය මැන බැලිය හැකි ආකාරයට ඉගෙනුම් පල දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතර දී හෝ අවසානයේ දී අපේක්ෂිත ඉගෙනුම් පල ශිෂ්‍යයා විසින් ලබා ගෙන තිබේ ද යන්න මැන බැලීම සඳහා ඇගයීම් හා තක්සේරු නිර්ණායක යොදා ගත යුතු ය.

ජපන් භාෂා විෂය නිර්දේශයේ 10 හා 11 ශ්‍රේණි සඳහා නිපුණතා 08 බැගින් ඇතුළත් කර ඇත. මෙම විෂය නිර්දේශයේ මූලික අරමුණ වන්නේ ව්‍යාකරණ ඉගැන්වීම මගින් නොව දෛනික අවශ්‍යතා, සිතුම් පැතුම් සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය වාක්‍ය රටා සහ සංවාද ප්‍රයෝගික ව පුහුණු වීමෙන් සන්නිවේදන හැකියාව ප්‍රගුණ කිරීමට වැඩි අවස්ථාවක් ලබා දීමයි. එමෙන් ම ඉගෙනුම ආරම්භයේ දී ම ජපන් භාෂාවේ ශබ්ද වලට සවන් දී නිවැරදි උච්චාරණයට ශිෂ්‍යයන් හුරු කිරීමත් ඉන් අනතුරුව අක්ෂර ලිවීමට, කියවීමට ඉගැන්වීමත් අපේක්ෂා කෙරේ. විශේෂයෙන් ම ජපන් ජාතිකයන්ගේ ජීවන රටාව හා සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබා දිම තුළින් ජපන් ජාතිකයන්ගේ සිතුම් පැතුම්, ආකල්ප, ආචාර ධර්ම හඳුනාගෙන භාෂාව වඩා හොඳින් හා නිවැරදි ව භාවිත කිරීමට සිසුන් යොමු කළ යුතුය. මෙම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකාවට උචිත ලෙස සංස්කරණය කර ලද දැනට තායිලන්තයේ භාවිත කරන පොත් කට්ටලයක් නිර්දිෂ්ට ග්‍රන්ථ ලෙස තෝරා ගෙන ඇත.

පෙළ පොතේ එක් එක් පාඩමක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ලබා දී ඇත. දී ඇති උපදෙස් ද සැලකිල්ලට ගනිමින් එක් එක් පාඩමෙන් ආවරණය වන විෂය කරුණුවලට අනුකූලව නියම කර ඇති කාලච්ඡේද සඳහා උචිත පාඩමක් සැලසුම් කර ගැනීමේ නිදහස ගුරුවරයාට ලැබේ. නිපුණතා, නිපුණතා මට්ටම් සහ විෂය අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කරමින් පාඩම අවසානයේ දී අපේක්ෂිත ඉගෙනුම් පල වෙත ශිෂ්‍යයාට ළඟා විය හැකි ආකාරයට පෙළපොතෙහි සඳහන් මුල් පාඩම් 19 සඳහා යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයක් මෙහි දක්වා ඇත. පෙළපොතෙහි සඳහන් අවසන් පාඩම් මගින් ජපානයේ සංස්කෘතිය හා ජීවන රටාව පිළිබඳ අවබෝධයක් ලබා දීම අපේක්ෂා කෙරෙන බැවින් මුල් පාඩම් 19 ඉගැන්වෙන අතර දී ම එම දැනුම ශිෂ්‍යයාට ලබා දිය හැකි පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ උපදෙස් මෙහි දක්වා ඇත. එමෙන් ම පෙළපොතේ එක් එක් පාඩම යටතේ දී ඇති සවන් දීමේ අභ්‍යාසවල නිරත කරවීමත් ඒ අනුව නිවැරදි උච්චාරණය පුහුණු කිරීමත් අත්‍යවශ්‍ය වේ.

ජපන් භාෂාවේ මූලික ශබ්ද වලට සවන් දී හඳුනා ගැනීම, උච්චාරණය සහ හිරගනා අක්ෂර,ලිවීම, කියවීම පළමු වාරය ආරම්භයේ දීත් කතකනා අක්ෂර දෙවන වාරය ආරම්භයේ දීත් ඉගැන්වීම, අපේක්ෂා කෙරේ. හිරගනා සහ කතකනා අක්ෂර ඉගැන්වීම සම්බන්ධ උපදෙස් ආරම්භයේ දී ලබා දී ඇත. ජපන් සංස්කෘතියට ආවේනික විනෝදාත්මක ක්‍රියාකාරකම් සහ ක්‍රීඩා හඳුන්වා දීම සඳහා පෙළපොතෙහි පාඩම් ඉගැන්වෙන අතරතුර දී කාලය වෙන් කර ගැනීමට ගුරුවරයාට නිදහස ඇත. එක් එක් පාඩම සඳහා ලබා දී ඇති ඇගයිම් නිර්ණායක පදනම් කර ගෙන අපේක්ෂිත ඉගෙනුම් පල වෙත ශිෂ්‍යයා ළඟා වී තිබේ දැයි මැන බැලීම සඳහා උචිත ක්‍රමවේදයක් ගුරුවරයා විසින් සැලසුම් කර ගත යුතු වේ.

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ලබා දී ඇත්තේ පෙළපොතෙහි එක් එක් පාඩම්වල විෂය අන්තර්ගතය ආවරණය කෙරෙන පොදු උපදෙස් මාලාවකි. එම යෝජිත ක්‍රියාකාරකම් සහ උපදෙස් සැලකිල්ලට ගෙන එහෙත් එයට සීමා නොවී තම හැකියාවන් ද ප්‍රයෝජනයට ගනිමින් උචිත පාඩමක් නිර්මාණාත්මක ව සැලසුම් කර ගැනීමේ නිදහස ගුරුවරයාට ඇත. එමෙන් ම හැකි පමණ පන්ති කාමරයේ දී නවීන තාක්‍ෂණය ද උපයෝගි කර ගැනීමට උත්සාහ ගත යුතු අතර අන්තර්ජාලය, පොත පත ඇසුරින් අමතර දැනුමක් ලබා ගැනීමට ශිෂ්‍යයා යොමු කිරීම වැදගත් වේ. ඉගැන්වීමේ ක්‍රියාවලියේ දි එක් එක් පාඩමේ සඳහන් විෂය කරුණු සහ වචන මාලාවට පමණක් සීමා නොවී ශිෂ්‍යයා ඒ වන විට ලබා ගෙන ඇති විෂය දැනුම ද උපයෝගි කර ගත හැකි පරිදි පාඩම සැලසුම් කර ගත යුතු වේ.

ව්‍යාපෘති නායක

# පටුන


| | පිටු අංක |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| පටුන | vii |
| විෂය නිර්දේශය | viii |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | 1-29 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 30 |

# ජපන් භාෂාව

## විෂය නිර්දේශය

## 10 ශ්‍රේණිය

# 01 විෂය හැඳින්වීම

ජපන් බස මව්බස ලෙස කථා කරන ජනගහනය බිලියන 120කට අධික ය. ඊට අමතර ව ලොව පුරා මිලියන 4කට අධික ජනසංඛ්‍යාවක් විදේශ භාෂාවක් ලෙස ජපන් භාෂාව හදාරති. ජපන් භාෂාවේ ඉතිහාසය සොයා බැලීමේ දී ජපන් භාෂාව සඳහා ලේඛන ක්‍රමයක් හඳුන්වා දී ඇත්තේ වසර 1500 කට පමණ පෙර බව වාර්තා වේ. පළමුවෙන් ම චීනයේ ලේඛන කටයුතු සඳහා භාවිත කරන ලද රූප අක්‍ෂර වර්ගයක් සේ සැලකෙන කන්ජි අක්‍ෂර චීන භාෂාවෙන් ජපන් භාෂාවට එකතු වී ඇත. වර්තමානයේ කන්ජි අක්‍ෂර 1950 පමණ එදිනෙදා ලේඛන කටයුතුවල දී භාවිත වන අතර, ජපානයේ ප්‍රාථමික සහ ද්විතියික පාසල් අධ්‍යාපනය අවසන් වන විට එදිනෙදා භාවිත වන එම කන්ජි අක්‍ෂර ප්‍රමාණය පිළිබඳ දැනුමක් ලබා ගෙන තිබීම අත්‍යාවශ්‍ය වේ. තවද වසර 1000කට පමණ පෙර තෝරා ගත් චීන අක්‍ෂර ආශ්‍රිත ව හිරගනා සහ කතකනා අක්ෂර හෝඩි නිර්මාණය කර තිබේ. වර්තමානයේ දී ජපන් ජාතිකයන් මෙම අක්‍ෂර වර්ග 03 ම භාවිත කරමින් ලේඛන කටයුතුවල යෙදෙයි.

මෙම විෂය නිර්දේශයේ ප්‍රධාන අරමුණු වන්නේ සාම්ප්‍රදායික ව්‍යාකරණ ඉගෙනීමෙන් බැහැර වී දෙන ලද වාක්‍ය රටා ඇසුරින් සංවාද ගොඩ නගමින් කථන කුසලතාව දියුණු කිරීමයි. ඒ සමගම ජපන් සංස්කෘතිය හා සමාජය පිළිබඳ අවබෝධය ලබා ගැනීමේ අවස්ථාව ද මෙමගින් හිමි වේ. ජපන් භාෂාව ඉගෙනීමේ දී එම භාෂාවට අනන්‍ය වූ සංස්කෘතික හා සමාජ වටිනාකම් පිළිබඳ අවබෝධයක් ලබා දීම ද ඉතා වැදගත් ය. ජපන් සමාජයෙන් ලබාගත හැකි උසස් ගුණාංග ජිවිතයට එකතු කර ගැනීමට ද ශිෂ්‍යයන්ට මෙහි දී හැකි වනු ඇත.

ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාවට ජපන් භාෂාව හඳුන්වා දී දශක කිහිපයක් ගතවී ඇති අතර අ.පොස.(සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) විභාග සඳහා විෂයයක් ලෙස ජපන් භාෂාව තෝරා ගැනීමේ අවස්ථාව සිසුන්ට ලැබී ඇත. කැලණිය විශ්ව විද්‍යාලය ප්‍රමුඛ විශ්ව විද්‍යාල කිහිපයකින් ම ජපන් භාෂාව සඳහා උපාධි පිරිනමනු ලබයි. අතීතයේ පටන් ශ්‍රී ලංකාව සහ ජපානය අතර ඇති ආර්ථික හා සංස්කෘතික සබඳතා පුළුල් කිරීමේ මගක් ලෙස ශ්‍රී ලංකාව තුළ ජපන් භාෂා අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා ජපන් රජයේ ද විශේෂ සහයෝගය ලැබේ. ජපන් භාෂාව හැදෑරීමෙන් උසස් අධ්‍යාපන අවස්ථා,දෙස් විදෙස් රැකියා අවස්ථා, ව්‍යාපාරික අවස්ථා සඳහා මං පෙත් විවර කර ගැනීමේ අවස්ථාව ශ්‍රී ලාංකිකයන්ට හිමි වී ඇත.

## 02 - ජපන් භාෂාව විෂය අධ්‍යයනයේ අරමුණු

1.0 ජපන් භාෂාවේ ශබ්ද නිවැරදි ව උච්චාරණය කිරිමේ හැකියාව ලබාදීම

2.0 ජපන් භාෂාව නිවැරදි ව ලිවීම සහ කියවීම

3.0 ශ්‍රවණය, කථනය යන කුසලතා දියුණු කිරීම

4.0 සරල කන්ජි ලිවීම, කියවීම සහ අර්ථය අවබෝධ කර ගැනීම

5.0 සංවාද ගොඩ නැගීම සඳහා අවශ්‍ය වාක්‍ය රටා හඳුනා ගැනීම

6.0 මූලික අවශ්‍යතා සහ

සිතුම් පැතුම් සන්නිවේදනය කිරිම සඳහා අවශ්‍ය සරල සංවාද ගොඩ නැගීම

7.0 ජපානයේ උසස් හර පද්ධතීන් හඳුනා ගැනීම සහ ඒවා තම ජීවිතයට එකතු කර ගැනීම

8.0 ජපන් ජාතිකයන්ගේ ජීවන රටාව හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගැනීම

## 03 ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කර ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

# 04 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම



(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටිමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක,සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම

යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## ජපන් භාෂාව - 10 ශ්‍රේණිය

### විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | |
|---|---|---|---|
| 10 | i. | 1.1, 1.2, 1.3, 1.4, 1.5, 2.1, 2.2, 3.2, 4.1, 6.1, 7.1, 7.3, 7.4, 8.1 | |
| | ii. | 1.5, 1.6, 2.2, 2.3, 3.1, 3.3, 5.1, 6.2, 7.4, 8.1 | |
| | iii. | 2.1, 2.3, 3.1, 4.1, 4.2, 7.2, 7.4, 8.1 | |
| | | එකතුව | |

**10 ශ්‍රේණිය** **ජපන් භාෂාව - විෂය නිර්දේශය.**

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 ජපන් භාෂාවේ මූලික ශබ්ද සහ අක්ෂර හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කර ලියයි. | 1.1 මූලික ශබ්දවලට සවන් දී හඳුනා ගනියි. | • මූලික ස්වර<br>• මූලික ව්‍යඤ්ජන | • ස්වර ශබ්ද වෙන් කර දක්වයි.<br>• ව්‍යඤ්ජන ශබ්ද වෙන් කර දක්වයි. | 20 |
| | 1.2 ශබ්දවලට සවන් දී උච්චාරණය කරයි. | • මූලික ස්වර සහ ව්‍යඤ්ජන<br>• දීර්ඝ ස්වර<br>• ඝෝෂ, අඝෝෂ ශබ්ද<br>• ව්‍යඤ්ජන ද්විත්ව කිරීම<br>• "ya"."yu"."yo" ශබ්ද<br>• "n"ශබ්දය | • ස්වර සහ ව්‍යඤ්ජන වශයෙන් ශබ්ද වෙන් කර හඳුනා ගෙන උච්චාරණය කරයි.<br>• විවිධ ශබ්ද ප්‍රභේද නම් කර දක්වයි.<br>• ශබ්ද නිවැරදි ව උච්චාරණය කරයි. | |
| | 1.3 සරල වචන, යෙදුම්වලට සවන් දී උච්චාරණය කරයි. | • සරල වචන<br>• සරල වාක්‍ය ඛණ්ඩ<br>• ආචාර කිරීම සඳහා භාවිත කරන යෙදුම් සහ වාක්‍ය ඛණ්ඩ | • සරල වචන නිවැරදි ව උච්චාරණය කරයි.<br>• වාක්‍ය ඛණ්ඩ උච්චාරණය කරයි.<br>• ආචාර කිරීම සඳහා උචිත යෙදුම් එක් රැස් කරයි.<br>• ආචාර යෙදුම් නිවැරදි ව උච්චාරණය කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 1.4 හිරගනා අක්ෂර නිවැරදි ව ලියයි, කියවයි. | • හිරගනා අක්ෂර | • හිරගනා අක්ෂර හඳුනා ගෙන මතකයෙන් ලියයි.<br>• සරල වචන ලියයි.<br>• දීර්ඝ ශබ්ද සහිත වචන ලියයි.<br>• ද්විත්ව කිරීම සහිත වචන ලියයි.<br>• "ya","yu","yo" ශබ්ද සහිත වචන ලියයි.<br>• "n" ශබ්දය සහිත වචන ලියයි.<br>• හිරගනා අක්ෂර භාවිත කර ලියූ වචන කියවයි. | |
| | 1.5 කතකනා අක්ෂර භාවිත කරන අවස්ථා හඳුනා ගනියි. | • විදේශිකයන්ගේ නම්<br>• විදේශ රටවල නම්<br>• විදේශ රටවල නගර<br>• විදේශ භාෂාවලින් ජපන් භාෂාවට ඇතුළත් වූ වචන | • කතකනා අක්ෂර භාවිත කළ යුතු අවස්ථා පැහැදිලි කරයි.<br>• විදේශිකයන්ගේ නම්, විදේශ රටවල නම්, නගරවල නම් ජපන් භාෂාවේ එන නිවැරදි ආකාරයට උච්චාරණය කරයි.<br>• විදේශ භාෂාවලින් ජපන් භාෂාවට ඇතුළත් වූ වචන එක් රැස් කරයි. | |
| | 1.6 කතකනා අක්ෂර නිවැරදි ව ලියයි, කියවයි. | • කතකනා අක්ෂර | • කතකනා අක්ෂර මතකයෙන් ලියයි.<br>• සරල වචන ලියයි.<br>• දීර්ඝ ශබ්ද සහිත වචන ලියයි.<br>• ද්විත්ව කිරීම සහිත වචන ලියයි.<br>• දීර්ඝ ශබ්ද සහිත වචන ලියයි.<br>• "ya","yu","yo" ශබ්ද සහිත වචන ලියයි.<br>• "n" ශබ්දය සහිත වචන ලියයි.<br>• කතකනා අක්ෂර භාවිත කර ලියූ වචන කියවයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 02 තමාට සමීප දේවල් සහ ක්‍රියකාරකම් පිළිබඳව ජපන් බසින් ප්‍රකාශ කරයි. | 2.1 තමා ව හඳුන්වා දෙයි. | • පුද්ගලයෙකු හඳුන්වාදීම සඳහා භාවිත කරන යෙදුම්<br>• නම ප්‍රකාශ කිරීම<br>• පවුලේ සාමාජිකයන්<br>• ජීවත් වන ප්‍රදේශය<br>• පාසල | • එකිනෙකා හඳුනා ගැනීමේ දී සුදුසු ආචාර පද භාවිත කරයි.<br>• තම නම ප්‍රකාශ කරමින් තමාව හඳුන්වා දෙයි.<br>• ජීවත්වන ප්‍රදේශය සහ පාසල පිළිබඳ ව සරල හැඳින්වීමක් කරයි.<br>• පවුලේ සාමාජිකයන් ව හඳුන්වා දෙයි. | 12 |
| | 2.2 ජපන් භාෂාවේ අංක භාවිත කරමින් තමාට සමීප දේවල් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | • ජපන් බසින් අංක හඳුන්වා දීම (1-100)<br>• වයස<br>• උපන් දිනය, මාසය, අවුරුද්ද<br>• ඉගෙනුම ලබන ශ්‍රේණිය<br>• වෙලාව<br>• දුරකථන අංක<br>• පුද්ගලයින් සංඛ්‍යාත්මක ව ගණන් කිරීම | • ජපන් බසින් ගණන් කරයි.<br>• තමාගේ වයස හා අන්‍යයන්ගේ වයස ප්‍රකාශ කරයි.<br>• උපන් දිනය, මාසය, සහ අවුරුද්ද ජපන් බසින් ප්‍රකාශ කරයි.<br>• ඉගෙනුම ලබන ශ්‍රේණිය පවසයි.<br>• නිවැරදි ව වේලාව පවසයි.<br>• දුරකථන අංකය ප්‍රකාශ කරයි.<br>• පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව පවසයි | |
| | 2.3 තම දෛනික කාර්යයන් පිළිබඳ සරලව ප්‍රකාශ කරයි. | • සතියේ දින<br>• දෛනික ක්‍රියාකාරකම් ප්‍රකාශ කිරිමට අවශ්‍ය මූලික ක්‍රියා පද<br>• දෛනික ක්‍රියාකාරකම් සිදු කරන වේලාව<br>• කාලසටහන සහ එහි අන්තර්ගත විෂයයන්<br>• කාලය හා සම්බන්ධ යෙදුම් පද - toki doki , itsumo mainichi<br>• වාක්‍ය ගොඩ නැගීමට අවශ්‍ය නිපාත පද- o/ni/de/e/wa/mo | • සතියේ දින මතකයෙන් ප්‍රකාශ කරයි.<br>• දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ සරල වාක්‍ය ගොඩ නගයි<br>• කාලසටහනේ දක්වෙන තොරතුරු පවසයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 03 ප්‍රිය කරන දේවල් පිළිබඳව අදහස් ප්‍රකාශ කරමින් සංවාද ගොඩ ගනියි. | 3.1. තමා ප්‍රිය කරන දේවල් පිළිබඳ ව ප්‍රකාශ කරයි. | • කැමැත්ත ප්‍රකාශ කිරිම<br>-----ga suki desu<br>-----ga daisuki desu<br><br>• අකමැත්ත ප්‍රකාශ කිරීම.<br>-----amari suki dewa arimasen<br>-----kirai desu<br>• ආහාර වර්ග<br>• සතුන් /සුරතල් සතුන්<br>• ප්‍රිය කරන විෂයයන්<br>• සංචාරය කිරීමට කැමැති ස්ථාන<br>• කිරීමට කැමැති ක්‍රියාකාරකම්<br>----- tai desu<br>----- te mitai desu | • යම් දෙයක් පිළිබඳ කැමැත්ත /අකමැත්ත ප්‍රකාශ කරයි.<br>• කිරීමට ප්‍රියකරන ක්‍රියාකාරකම් සරල ව ප්‍රකාශ කරයි.<br>• එකිනෙකා ප්‍රිය කරන දේ පිළිබඳව සරල සංවාද ගොඩනගයි. | 10 |
| | 3.2 තම විනෝදාංශ පිළිබඳ ව ප්‍රකාශ කරමින් අදහස් හුවමාරු කර ගනියි. | • විනෝදාංශ<br>-----shumi wa nan desuka<br>-----koto desu | • තම විනෝදාංශ පවසයි.<br>• මිතුරන්ගේ විනෝදාංශ අසා දැනගනියි. | |
| | 3.3 යම් ස්ථානයක ඇති භාණ්ඩ හඳුනාගෙන ඒවායෙහි පිහිටීම පිළිබඳ ව විස්තර කරයි. | • කාමරයේ/ නිදන කාමරයේ ඇති උපකරණ හා භාණ්ඩ | • කාමරයක තබා ඇති භාණ්ඩ ජපන් බසින් නම් කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 04 තම අවශ්‍යතා, ප්‍රිය කරන දේවල්, දෛනික කටයුතු පිළිබඳ ව ලියයි. | 4.1. සරල ජපන් බසින් තමා පිළිබඳ ව හැඳින්වීමක් ලියයි.<br><br>4.2 තම දෛනික ක්‍රියාකාරකම් සරල ජපන් බසින් ලියයි. | • නම, ශ්‍රේණිය,වයස<br>• පදිංචි ස්ථානය<br>• පවුලේ සාමාජිකයන්<br><br>• දින පොත් භාවිතය<br>- දිනය<br>- වේලාව<br>- දෛනික ක්‍රියාකාරකම් | • තමා පිළිබඳ ව කෙටි හැඳින්වීමක් ලියයි.<br>• යහළුවන් පිළිබඳ ව කෙටි හැඳින්වීමක් ලියයි.<br><br>• තම දෛනික ක්‍රියාකාරකම් දින පොතක සටහන් කරයි.<br>• තමා, තම පවුල සහ දෛනික කටයුතු පිළිබඳ ව කෙටි විස්තර සටහන් කරයි. | 10 |
| 05 සරල ජපන් බසින් ලියැවුණු තොරතුරු කියවා අවබෝධ කර ගනියි. | 5.1 ජපන් භාෂාවෙන් ලියූ කාල සටහන්, දින දර්ශන, මෙනුපත් ආදිය කියවා අවබෝධ කර ගනියි. | • පන්ති කාල සටහන<br>- විෂයයන්ගේ නම්<br>- සතියේ දින<br>- වේලාව<br>• දින දර්ශන<br>• දින පොත්<br><br>• ජපන් බසින් ලියූ මෙනු පත් | • සරල ජපන් බසින් ලියා ඇති සටහන් කියවයි.<br>• පන්ති කාල සටහනේ ඇති තොරතුරු කියවා සරල බසින් විස්තර කරයි.<br><br>• කාල සටහන, දින දර්ශන කියවා ඒ ඇසුරින් අසන ප්‍රශ්න වලට පිළිතුරු දෙයි.<br><br>• මෙනු පත් කියවා තමා ප්‍රිය කරන ආහාර තෝරා ගනියි. | 10 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 06 එදිනෙදා ජීවිතයට අවශ්‍ය සරල තොරතුරුවලට සවන් දී අවබෝධ කර ගනියි. | 6.1. පන්ති කාමරයේ දී ගුරුවරයාගේ උපදෙස් වලට සවන් දී ඊට අනුකූල ව ක්‍රියා කරයි. | • පන්ති කාමරයේ දී භාවිත කරන පද සහ යෙදුම්<br>• උපදෙස් සහ විධාන | • ගුරුවරයාගේ උපදෙස් වලට අනුව කටයුතු කරයි.<br>• ගුරුවරයා අසන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලබා දෙයි. | 10 |
| | 6.2 දෛනික ජීවිතයට අවශ්‍ය උපදෙස් සහ තොරතුරුවලට සවන් දී අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි. | • පුද්ගල නාම<br>• ප්‍රදේශ /රටවල නම්<br>• ආචාර කිරීම සඳහා භාවිත කරන පද/ යෙදුම්<br>• පන්ති කාල සටහනේ සඳහන් තොරතුරු<br>• දුරකථන අංක | • පන්ති කාමරයේ දී ගුරුවරයා පවසන තොරතුරුවලට සවන් දී සටහන් කරයි.<br>• ගුරුවරයා අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි. | |
| 07 ජපන් භාෂාව හා බැඳුණු ජපන් සංස්කෘතිය ආචාර ධර්ම, සමාජ චාරිත්‍ර වටිනාකම් හඳුනා ගනියි. | 7.1 සමාජ මට්ටම, පුද්ගල තරාතිරම සහ වයස අනුව සුදුසු ලෙස ආචාර කරයි. | • ආචාර කරන නිවැරදි ක්‍රමය<br>• ආචාර කිරීම සඳහා භාවිත කරන පද/යෙදුම් | • නිවැරදි ක්‍රමයට සුදුසු ලෙස ආචාර කරයි.<br>• ආචාර කිරීම සඳහා සුදුසු පද / යෙදුම් භාවිත කර ආචාර කරයි. | |
| | 7.2 අන්තර් පුද්ගල සබඳතා පවත්වා ගැනීමට අවශ්‍ය මූලික සිද්ධාන්ත අවබෝධ කර ගනියි. | • සුදුසු ආචාර විධි<br>• අන්‍යයන් කෙරෙහි ගෞරවය, ස්තුතිය, කණගාටුව, සහ ආචාරය ප්‍රකාශ කිරීමේ ක්‍රම<br>- වාචික ව<br>- ක්‍රියා භාව මගින් | • ආචාර කිරීම සඳහා පුද්ගලයාට හා අවස්ථාවට ගැළපෙන නිවැරදි යෙදුම් /පද භාවිත කරයි.<br>• අන්‍යයන් කෙරෙහි තම හැඟීම් වාචික ව මෙන් ම ක්‍රියාභාව මගින් නිවැරදි ව ප්‍රකාශ කරයි. | 08 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 7.3. අවස්ථානුකූලව සුදුසු ලෙස පුද්ගලයන් ආමන්ත්‍රණය කරයි.<br><br>7.4 ජපන් සංස්කෘතියට ආවේණික විනෝදාත්මක ක්‍රියාකාරකම් සහ ක්‍රීඩා හඳුනා ගනියි. | • ආමන්ත්‍රණ විධි<br>- හිතවතුන් සඳහා<br>- පවුලේ සාමාජිකයන් සඳහා<br>- තරාතිරමෙන් සහ සමාජ මට්ටමෙන් ඉහළ පුද්ගලයන් සඳහා<br>- වැඩිමහල් පුද්ගලයන් සඳහා<br><br>• විනෝදාත්මක ක්‍රීඩා<br>- karuta tori<br>- hayakuchi kotoba<br>- shiri tori<br><br>• විවිධ සම්ප්‍රදායික අත්කම්<br>- furo-shiki<br>- origami<br>- shodô<br>- ikebana<br><br>• ජපන් ගීත<br>- obento bako no uta<br>- medaka no gakko<br>- ojisan no furu dokei<br>- sakura<br><br>• ගුරුවරයා විසින් හඳුන්වා දෙනු ලබන සරල ගීත | • සුදුසු වචන භාවිත කර අන්‍යයන් ආමන්ත්‍රණය කරයි.<br>• ගෞරවාන්විත ව සහ ආචාරශීලී ලෙස පුද්ගලයන් ආමන්ත්‍රණය කරයි.<br><br>• විනෝදාත්මක ක්‍රීඩා හඳුනා ගෙන ක්‍රීඩාවේ නිරතවෙයි.<br><br>• සම්ප්‍රදායික අත්කම් පිළිබඳ ව කෙටියෙන් විස්තර කරයි.<br>• අත්කම් තමා විසින් ම අත්හදා බලයි.<br><br>• ජපන් ගීතවලට සවන් දී රස විඳියි<br>• ජපන් ගීත එක් ව ගායනා කරයි.<br>• ප්‍රියක රන ගීත සටහන් කර ගනියි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 08 ජපන් සමාජය හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි. | 8.1. ජපන් සමාජය හා සංස්කෘතිය පිළිබඳ මූලික කරුණු අවබෝධ කර ගනියි. | • ජපන් ජාතිකයන්ගේ නම්<br>- වාසගම<br>- පිරිමි සහ කාන්තාවන්ගේ නම්<br>- පුද්ගල නාමවල අර්ථය<br>- දෙරටේ පුද්ගල නාම අතර සමාන අසමානතා | • පිරිමි හා කාන්තා නම් වෙන්කර දක්වයි.<br>• මුල් නම සහ වාසගම යොදන පිළිවෙළ පවසයි.<br>• ජපන් ජාතිකයන්ගේ නම් පිළිබඳ ව තම අදහස් දක්වයි. | 10 |
| | 8.1 ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනාගෙන මව් බසින් අදහස් ප්‍රකාශ කරය | • ජපන් ජාතික ශිෂ්‍යයන් පිළිබඳ<br>- ජපන් ජාතික ශිෂ්‍යයන් ප්‍රිය කරන දේ<br>- ඔවුන්ගේ ආවේග සහ සිතුම් පැතුම්<br>- විනෝදාංශ<br>- දෛනික කටයුතු<br>- දෙරට ශිෂ්‍යයන්ගේ මිත්‍ර සබඳතා අතර ඇති සමාන අසමානතා | • ජපන් ශිෂ්‍යයන්ගේ සිතුම් පැතුම්,ආවේග, ප්‍රිය කරන දේ පිළිබඳ ව විස්තර කරයි.<br>• ජපන් ශිෂ්‍යයන්ගේ දෛනික කටයුතු සහ විනෝදාංශ හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• සම වයසේ ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ මිත්‍ර සබඳතා තමා සමඟ සසඳමින් අදහස් ප්‍රකාශ කරයි. | |
| | | • ජපන් පවුල සහ පවුල් සබඳතා<br>- ජපන් පවුලක සාමාජික සංඛ්‍යාව<br>- ජපන් ජාතිකයන්ගේ පවුල් සබඳතා<br>- දෙරටේ පවුල් අතර ඇති සමාන අසමානතා | • ජපන් පවුලක සාමාජිකයන් අතර සබඳතාව විස්තර කරයි.<br>• දෙරටේ පවුල් අතර ඇති සමානතා අසමානතා පැහැදිලි කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | • ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන කටයුතු<br>- ශිෂ්‍යයන් ප්‍රිය කරන විෂයයන්<br>- අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ගත කරන කාල සීමාව<br>- අධ්‍යාපන කටයුතු සඳහා ඇති උනන්දුව<br>- අමතර පන්ති/ උපකාරක පන්ති<br>- විශ්ව විද්‍යාලවලට බඳවා ගන්නා ශිෂ්‍ය අනුපාතිකය<br>- විශ්වවිද්‍යාලවල ඇති අධ්‍යයන පීඨ | • ජපානයේ සම වයස් ශිෂ්‍යයන්ගේ ප්‍රියතම විෂයයන් පිළිබඳ ව විස්තර කරයි.<br>• සම වයසේ ශිෂ්‍යයන්ගේ කාලසටහන තම කාලසටහන් සමග සසඳයි<br>• ජපානයේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ තම අදහස් ප්‍රකාශ කරයි. | |
| | | • ජපානයේ යෞවනයන්ගේ පාසල් ජීවිතය<br>– ජපානයේ පාසල් වර්ග<br>- ප්‍රාථමික<br>- ද්විතියික<br>- උසස්<br>– පාසල්වල ඇති පහසුකම්<br>– පාසල් දිවා ආහාරය<br>– පාසල් දින දර්ශනය<br>– පාසල් කාලසටහන<br>– නිල ඇඳුම්<br><br>– පාසල් ජීවිතය<br>- කණිෂ්ඨ ශිෂ්‍යයන්<br>- ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් | • ජපානයේ පාසල් වර්ග 3ක් ඇති බව හඳුනාගෙන නම් කරයි.<br>• ජපානයේ පාසල්වල ඇති පහසුකම් සහ කාලසටහන තම පාසල සමග සසඳයි.<br><br>• ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ පාසල් ජීවිතය පිළිබඳ සරල ව විස්තර කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ● ජපානයේ යෞවනයන්ගේ ආහාර පුරුදු<br>- ශිෂ්‍යයන් ප්‍රිය කරන ආහාර වර්ග<br>- ශිෂ්‍යයන්ගේ උදේ ආහාරය<br>- දිවා ආහාරය ගන්නා ස්ථාන<br>- ආහාර ගැනීමේ දී අනුගමනය කරන සිරිත් විරිත්<br>- විවිධ ආහාර පුරුදු<br>- දෙරටේ ආහාර පුරුදුවල සමාන අසමානතා | ● ජපන් ශිෂ්‍යයන් ප්‍රිය කරන ආහාර වර්ග නම් කර ශ්‍රී ලංකාව සමග සසඳයි<br>● ජපන් සිසුන්ගේ ආහාර පුරුදු සහ චර්යා විස්තර කරයි.<br>● දෙරටේ ආහාර පුරුදුවල සමාන අසමානතා ප්‍රකාශ කරයි. | |
| | | ● ජපානයේ සංචාරක ස්ථාන සහ ජපන් ජාතිකයන්ගේ සංචාරක කටයුතු<br>- ශ්‍රීලංකාවේ සංචාරය කරන ජපන් ජාතිකයන් සංඛ්‍යාව<br>- ජපානයේ සංචාරය කරන විදේශකයන්ගේ හා ජපන් ජාතිකයන්ගේ සිත්ගත් ස්ථාන<br>- ජපන් සංචාරකයන් පිළිබඳ ව සිසුන් දන්නා කරුණු | ● ජපානයේ ප්‍රකට සංචාරක ස්ථාන හඳුනා ගෙන නම් කරයි.<br>● ජපන් ජාතිකයන් ප්‍රිය කරන ශ්‍රී ලංකාවේ සංචාරක ස්ථාන පිළිබඳ අදහස් දක්වයි.<br>● ජපන් සංචාරකයන් පිළිබඳ ව තමන් දන්නා කරුණු ඉදිරිපත් කරයි. | |
| | | - ජපානයේ ප්‍රසිද්ධ සංචාරක ස්ථාන<br>- ජපානයේ උණුදිය උල්පත් සංඛ්‍යාව සහ උණුදිය උල්පත්වලින් ස්නානය කිරීමේ දී පිළිපැදිය යුතු ආචාර ධර්ම<br>- පාසල් අධ්‍යාපන චාරිකා<br>- සංචාරය පිළිබඳ ශ්‍රීලාංකිකයින් සහ ජපන් ජාතිකයින් දක්වන අදහස් සැසඳීම | ● සංචාරයක දී ජපන් ජාතිකයන් පිළිපදින ආචාර ධර්ම විස්තර කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | • ජපානයේ ප්‍රධාන ආහාර<br>- විදේශිකයන් ප්‍රිය කරන /අප්‍රිය කරන ජපන් ආහාර<br>- ජපන් නූඩ්ලස් වර්ග<br>- Donburi<br>- Teishoku<br>- ජපන් ජාතිකයන් ආහාර ගන්නා ක්‍රම සහ පිළිපැදිය යුතු සිරිත් විරිත්<br>- දෙරටේ ආහාර වට්ටෝරුවල සමාන අසමානතා | • ජපානයේ ප්‍රධාන/ජනප්‍රිය ආහාර නම් කරයි.<br>• විදේශිකයන්ට ගැළපෙන ආහාර හඳුනාගෙන නම් කරයි.<br>• ජපන් ජාතිකයින් ආහාර ගැනීමේ දී පිළිපදින සිරිත් විරිත් හඳුනාගෙන ශ්‍රීලංකාව සමග සසඳයි.<br>• දෙරටේ ආහාරවල සමාන අසමානතා වෙන් කර දක්වයි. | |
| | | • ජපානයේ දේශගුණය සහ භූගෝලීය ලක්ෂණ<br>- ජපානයේ විශාලත්වය<br>- ෆුජි කන්ද | • ජපානයේ ප්‍රධාන භූගොලීය ලක්ෂණ පිළිබඳ සටහනක් පිළියෙල කරයි.<br>• ජපානයේ ඍතු භේදය පිළිබඳ තොරතුරු රැස් කරයි. | |
| | | • ජපානයේ දේශගුණය<br>- ජපානයේ අව ම සහ උපරි ම උෂ්ණත්වය<br>- ඍතු ශබ්දය<br>- දෙරටේ දේශගුණය සහ භූගෝලීය ලක්ෂණ සැසඳීම | • ජපානයේ දේශගුණය ශ්‍රීලංකාව සමග සසඳයි | |

## නිර්දිෂ්ට ග්‍රන්ථ (අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට නියමිත)

- Koharu to isshoni - Nihongo I
- Koharu to isshoni - Nihongo II

## අතිරේක කියවීම සඳහා

- Nihongo shoho,The Japan Foundation, 1985
- Japanese for young people I - student book
- Japenese for young people I - kana work book

## 04 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද

- ප්‍රශ්නෝත්තර ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය
- දේශන
- පැවරුම්
- කේවල/කණ්ඩාම් ක්‍රියාකාරකම්
- විනෝදාත්මක ක්‍රීඩා
- කේවල/ කණ්ඩායම් ඉදිරිපත් කිරීම්

## 05 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

- ජපන් භාෂා දිනයක් පැවැත්වීම
- බිත්ති පුවත්පතක් පවත්වා ගෙන යෑම
- මාසික සඟරාවක් සකස් කිරීම
- ප්‍රදර්ශන, වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම
- පන්ති මට්ටමෙන් පුස්තකාලයක් පවත්වා ගෙන යෑම
- ජපානයේ සංස්කෘතිය පිළිබඳ ව පොත් පිංචක් සකස් කිරීම.
- ජපානයේ සංස්කෘතික උත්සව නිමිතිකරගෙන විශේෂ වැඩ සටහන් සංවිධානය කිරීම

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## ඒකකය 01

**නිපුණතාව**

01 ජපන් භාෂාවේ මූලික ශබ්ද සහ අක්ෂර හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කර ලියයි.

**නිපුණතා මට්ටම**

1.1 මූලික ශබ්දවලට සවන් දී හඳුනාගනියි.
1.2 ශබ්දවලට සවන් දී උච්චාරණය කරයි.
1.3 සරල වචන, යෙදුම්වලට සවන් දී උච්චාරණය කරයි.

**කාලච්ඡේද 03 යි**

**ඉගෙනුම් පල**

- ස්වර සහ ව්‍යඤ්ජන වශයෙන් ශබ්ද වෙන්කර දක්වයි.
- ස්වර ශබ්ද සහ ව්‍යඤ්ජන ශබ්ද වෙන් කර හඳුනා ගෙන නිවැරදි ව උච්චාරණය කරයි.
- විවිධ ශබ්ද ප්‍රභේදවලට අයත් ශබ්ද උච්චාරණය කරයි.
- සරල වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- වාක්‍ය ඛණ්ඩ හා සරල වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි.
- ආචාර යෙදුම් නිවැරදි ව උච්චාරණය කරයි.
- සිංහල භාෂාවේ සහ ජපන් භාෂාවේ ඇති සමාන ශබ්ද සහ සිංහල භාෂාවේ නොමැති ජපන් භාෂාවේ ඇති විශේෂිත ශබ්ද වෙන් කර ලියයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- මූලික ස්වර ශබ්ද 5
  a. i, u, e, o
- මූලික ව්‍යඤ්ජන ශබ්ද
- දීර්ඝ ස්වර ශබ්ද හඳුනා ගැනීම සහ උච්චාරණය
- ඝෝෂ අඝෝෂ ශබ්ද භේදය හඳුනා ගැනීම සහ උච්චාරණය
- ව්‍යඤ්ජන ද්විත්ව කිරීම
- විශේෂිත ශබ්ද - ya, yu, yo, n උච්චාරණය

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ජපන් භාෂාවේ උච්චාරණ විශේෂතා පිළිබඳ අවධානය යොමු කරමින් මූලික ශබ්දවලට සවන් දීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- මූලික ශබ්ද ස්වර සහ ව්‍යඤ්ජන ලෙස වෙන් කර දක්වන්න.
- හඬ පටයකට සවන් දීමට සලස්වා නිවැරදි උච්චාරණය හුරු කරන්න.
- සිංහල හා ජපන් යන භාෂා දෙකෙහි ඇති සමාන ශබ්ද සහ සිංහල භාෂාවෙහි නොමැති ජපන් භාෂාවේ ශබ්ද වෙන් කර දක්වන්න.
- දීර්ඝ ස්වර, ඝෝෂ, අඝෝෂ ශබ්ද සහ ව්‍යඤ්ජන ද්විත්ව කිරීමේ දී උච්චාරණය කළ යුතු ආකාරය පුහුණු කරන්න.
- සරල වචන සහ ආචාර යෙදුම් සහිත වචන ලැයිස්තුවක් ලබා දී නිවැරදි උච්චාරණය පුහුණු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සී.ඩී./ඩී.වී.ඩී

**තක්සේරුව හා ඇගයීම**

- මූලික ශබ්දවලට සවන් දී උච්චාරණ විශේෂතා හඳුනා ගෙන ස්වර සහ ව්‍යඤ්ජන ලෙස ශබ්ද වෙන් කරයි.
- ස්වර සහ ව්‍යඤ්ජන ශබ්ද නිවැරදි ව උච්චාරණය කරයි.
- වචන හා වාක්‍ය ඛණ්ඩ නිවැරදි ව උච්චාරණය කරයි.
- සිංහල භාෂාවේ නොමැති ජපන් භාෂාවට අයත් ශබ්ද නම් කර උච්චාරණය කරයි.

## ඒකකය 02

**නිපුණතාව**

01 ජපන් භාෂාවේ මූලික ශබ්ද සහ අක්ෂර හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කර ලියයි.

**නිපුණතා මට්ටම**

1.4 හිරගනා අක්ෂර නිවැරදි ව ලියයි, කියවයි.

**කාලච්ඡේද 07 යි.**

**ඉගෙනුම් පල**

- හිරගනා අක්ෂර හඳුනා ගෙන අදාළ ශබ්දය නිවැරදි ව උච්චාරණය කරයි.
- හිරගනා අක්ෂර මතකයෙන් ලියයි.
- ජපන් භාෂාවේ ශබ්දවලට සවන් දී නියමිත අක්ෂරය ලියයි.
- හිරගනා අක්ෂර භාවිත කර සරල වචන ලියයි.
- දීර්ඝ ශබ්ද සහිත වචන ලියයි.
- ද්විත්ව ශබ්ද සහිත වචන ලියයි.
- "ya", "yu"," yo" ශබ්ද සංයෝග සහිත වචන ලියයි.
- n ශබ්දය සහිත වචන ලියයි.
- හිරගනා අක්ෂර භාවිත කර ලියූ වචන කියවයි.
- වචනවලට සවන් දී හිරගනා අක්ෂර භාවිත කර ලියයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- හිරගනා හෝඩිය
- සරල වචන
- ශබ්ද ප්‍රභේද සහිත සංකීර්ණ වචන

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- වරකට හිරගනා අක්ෂර 5 බැගින් හඳුන්වා දෙන්න.
- අක්ෂර ලියන නිවැරදි පිළිවෙළ හඳුන්වා දී ඒ අනුව අක්ෂර ලිවීමට උපදෙස් දෙන්න.
- උගන්වන ලද අක්ෂර ඇතුළත් අක්ෂර 2, 3 ආදි වශයෙන් අක්ෂර සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වන වන සේ වචන මාලාවක් සකස්කර ලිවීමේ අභ්‍යාස කරවන්න.
- ශබ්ද ප්‍රභේද සහිත සංකීර්ණ වචනවලට සවන් දී ලිවීම සඳහා සිසුන්ට උපදෙස් දෙන්න.
- හිරගනා අක්ෂර භාවිත කර ලියූ සරල ඡේද හඬ නගා කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් කර හිරගනා අක්ෂර කාඩ්පත් භාවිත කර ගුරුවරයා ලබාදෙන වචන සෑදීමේ ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හිරගනා හෝඩිය විශාල කර ලියන ලද බ්‍රිස්ටල් බෝඩ්
- අක්ෂර ලියූ කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- හිරගනා හෝඩියේ අක්ෂර අනුපිළිවෙළින් කියයි.
- හිරගනා අක්ෂර භාවිත කර සරල වචන ලියයි.
- හිරගනා අක්ෂර භාවිත කර සංකීර්ණ වචන ලියයි.
- හිරගනා අක්ෂර භාවිත කර ලියූ සරල ඡේද කියවයි.

**ඒකකය 03**

**නිපුණතාව**

01 ජපන් භාෂාවේ මූලික ශබ්ද සහ අක්ෂර හඳුනා ගෙන නිවැරදි ව උච්චාරණය කර ලියයි.

**නිපුණතා මට්ටම**

1.5 කතකනා අක්ෂර භාවිත කරන අවස්ථා හඳුනා ගනියි.

1.6 කතකනා අක්ෂර නිවැරදි ව ලියයි, කියවයි.

**කාලච්ඡේද 10 යි.**

**ඉගෙනුම් පල**

- කතකනා අක්ෂර භාවිත කළ යුතු අවස්ථා හඳුනා ගෙන පැහැදිලි කරයි.
- විදේශිකයින්ගේ නම්, විදේශ රටවල සහ නගරවල නම් ජපන් භාෂාවේ උච්චාරණයට අනුකූල ව උච්චාරණය කරයි.
- විදේශ භාෂාවලින් ජපන් භාෂාවට එකතු වූ වචන එක් රැස් කරයි.
- කතකනා අක්ෂර හඳුනාගෙන අදාළ ශබ්දය නිවැරදි ව කියවයි/උච්චාරණය කරයි.
- කතකනා අක්ෂර මතකයෙන් ලියයි.
- ශබ්දවලට සවන් දී නියමිත අක්ෂරය ලියයි.
- කතකනා අක්ෂර භාවිත කර සරල වචන ලියයි.
- විවිධ ශබ්ද ප්‍රභේද සහිත සංකීර්ණ වචන ලියයි.
- කතකනා අක්ෂර භාවිත කර ලියූ වචන කියවයි.
- වචනවලට සවන් දී කතකනා අක්ෂර භාවිත කර ලියයි.
- තමා දන්නා විදේශ රටවල නම් සහ විදේශිකයන්ගේ නම් කතකනා අක්ෂර භාවිත කර ලියයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- කතකනා හෝඩිය
- විදේශිකයන්ගේ නම්, විදේශ රටවල් සහ නගරවල නම්
- විදේශ භාෂාවලින් ජපන් භාෂාවට එකතු වූ වචන

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- කතකනා අක්ෂර භාවිත කළ යුතු අවස්ථා විස්තර කරන්න.
- විදේශ රටවල නම්, නගරවල නම් සහ විදේශිකයන්ගේ නම්, ජපන් භාෂාවේ උච්චාරණයට අනුකූල ව උච්චාරණය කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.
- විදේශ භාෂාවලින් ජපන් භාෂාවට ඇතුළත් වූ වචන මාලාවක් ලබා දී හඬ නගා උච්චාරණය කිරීමට උපදෙස් දෙන්න.
- වරකට කතකනා අක්ෂර 05 බැගින් හඳුන්වා දෙන්න.
- අක්ෂර ලියන නිවැරදි පිළිවෙළ හඳුන්වා දෙන්න.
- වචන මාලාවක් ලබා දී කතකනා අක්ෂර භාවිත කර ලිවීමේ අභ්‍යාස කරවන්න.
- කතකනා අක්ෂර භාවිත කළ යුතු වචනවලට සවන් දී අසා ලිවීමේ අභ්‍යාසයක නිරත කරවන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර කතකනා අක්ෂර කාඩ්පත් එකතු කර ගුරුවරයා දෙන වචන සෑදීමේ ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- කතකනා හෝඩිය විශාල කර ලියන ලද බ්‍රිස්ටල් බෝඩ්
- අක්ෂර ලියූ කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- විදේශ රටවල සහ නගරවල නම්, විදේශකයන්ගේ නම්, ජපන් භාෂාවේ උච්චාරණයට අනුකූලව උච්චාරණය කරයි.
- කතකනා අක්ෂර භාවිත කර වචන ලියයි
- කතකනා අක්ෂර භාවිත කර ලියූ වචන කියවයි.

## ඒකකය 04

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියාකාරකම් පිළිබඳ ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

07 ජපන් භාෂාව හා බැඳුණු ජපන් සංස්කෘතිය ආචාර ධර්ම, සමාජ වටිනාකම් හඳුනා ගනියි.

08 ජපන් සමාජය හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

2.1 තමා ව හඳුන්වා දෙයි.

7.1 සමාජ මට්ටම, පුද්ගල තරාතිරම සහ වයස අනුව සුදුසු ලෙස ආචාර කරයි.

8.1. ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- තමා ව හඳුන්වාදීමේ දී සුදුසු ආචාර විධි සහ යෙදුම් භාවිත කරයි.
- ජපන් බසින් තම නම හඳුන්වා දී අන්‍යයන්ගේ නම් අසා දැන ගනියි.
- ජපන් ජාතිකයින්ගේ මුල් නම සහ වාසගම නිවැරදි අනුපිළිවෙළට ප්‍රකාශ කරයි.
- පුද්ගල නම් සහ ආචාර කිරීමේ දී භාවිත කරන යෙදුම්වලට සවන් දී අවබෝධ කර ගනියි.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ පුද්ගල නම්, ආමන්ත්‍රණ විධි, ආචාර ක්‍රම සහ යෙදුම් වල සමානතා සහ අසමානතා සසඳමින් මවු බසින් අදහස් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- තමා පිළිබඳ ව සරල ව හඳුන්වා දීම
- ජපන් ජාතිකයන්ගේ නම්
- ආචාර විධි සහ යෙදුම්

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ජපන් බසින් තමා ව හඳුන්වා දී ආචාර කිරීමේ දී ජපන් ජාතිකයන් භාවිත කරන ඉරියව්ව නිරූපණය කර පෙන්වන්න.
- ශිෂ්‍යයන් කිහිප දෙනකු පන්තිය ඉදිරියට කැඳවා ගුරුවරයා අනුකරණය කරමින් තමා ව හඳුන්වා දී අනෙක් ශිෂ්‍යයන්ට ආචාර කිරීමට පවසන්න.
- පුද්ගලයකු හඳුන්වා දීම සඳහා භාවිත කරන වාක්‍ය ඛණ්ඩ කළුලෑල්ලේ සටහන් කර නිවැරදි ව උච්චාරණය කරමින් පුහුණු වීමට ශිෂ්‍යයන්ට අවස්ථාව දෙන්න.
- ශිෂ්‍යයන් දෙදෙනා බැගින් කණ්ඩායම් කර එකිනෙකා ජපන් බසින් හඳුන්වා ගන්නා ආකාරය පුහුණු වීමේ අභ්‍යාසවල යොදවන්න.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ භාවිත කරන ආචාර විධි සහ යෙදුම්වල සමාන අසමානතා පිළිබඳ පැහැදිලි කරන්න.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ භාවිත කරන පුද්ගල නම් සහ ආමන්ත්‍රණ විධිවල සමාන අසමානතා පිළිබඳ සාකච්ඡා කරන්න.
- හඬ පටයකට හෝ ගුරුවරයාගේ උච්චාරණයට සවන් දී නිවැරදි උච්චාරණය පුහුණු වීමට අවස්ථාව දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත 01 පාඩම සහ 20 පාඩම

**තක්සේරුව හා ඇගයීම**

- සුදුසු ආචාර විධි සහ යෙදුම් භාවිත කරමින් තමා ව හඳුන්වා දෙයි.
- අන්‍යයන්ගේ නම් විමසා එකිනෙකා හඳුනා ගනියි.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ ආචාර විධිවල සමාන/අසමාන ලක්ෂණ පැහැදිලි කරයි.

## ඒකකය 05

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියාකාරකම් පිළිබඳ ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම**

2.2 ජපන් භාෂාවේ අංක භාවිත කරමින් තමාට සමීප දේවල් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- ජපන් භාෂාවෙන් අංක 0 සිට 9 දක්වා වූ සංඛ්‍යා/ හඳුනාගෙන ගණන් කරයි.
- සවන් දී නිවැරදි ව අංක ලියයි.
- දූරකථන අංක ජපන් බසින් පවසයි.
- අන්‍යයන්ගේ දූරකථන අංක විමසා දැන ගනියි.
- දූරකථන අංක විමසා නිවැරදි ව සටහන් කර ගනියි.
- ශ්‍රී ලංකාවේ සහ ජපානයේ දූරකථන අංක යෙදන රටාවේ සමාන අසමානතා පිළිබඳ ව මවු බසින් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- 0 - 9 දක්වා සංඛ්‍යා
- දූරකථන අංක භාවිතයේ දී ජපානයේ අංකය 81 ලෙස ද ශ්‍රී ලංකාවේ අංකය 94 ලෙස භාවිත කරයි.
- ජපානයේ ප්‍රධාන නගරවලට අදාළ වන අංක

| | |
|---|---|
| තෝකියෝ | 03 |
| ඕසාකා | 05 - 66 |
| සප්පොරො | 011 |
| නගෝයා | 052 |

- ජපානයේ ජංගම දූරකථන සඳහා භාවිත වන විශේෂ අංක 070, 080, 090 වේ.
- ජපානයේ පොලිස් ස්ථාන සඳහා විශේෂ අංකය 110 වේ
- ගිනිනිවන රථ සහ ගිලන් රථ අංකය 119 වේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 1**

- 0 - 9 දක්වා අංක ජපන් බසින් හඳුන්වා දෙන්න.
- අංක මතකයෙන් පැවසීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ දූරකථන අංකවල සමාන අසමානතා පිළිබඳ සාකච්ඡාවක නිරතවන්න.
- ජපන් බසින් දූරකථන අංක විමසීම සහ පිළිතුරු සපයන ආකාරය කළු ලෑල්ලේ සටහන් කර පුහුණු වීම සඳහා ශිෂ්‍යයන් කණ්ඩායම් වශයෙන් වෙන් කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත - 2 පාඩම

**තක්සේරුව හා ඇගයීම**

- ජපන් බසින් අංක 0 - 9 දක්වා පිළිවෙළට ගණන් කරයි.
- සවන් දී 0 - 9 දක්වා අංක ලියා දක්වයි.
- දූරකතන අංක ජපන් බසින් පවසයි.

## ඒකකය 06

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියාකාරකම් පිළිබඳව ජපන් බසින් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම**

2.2 ජපන් භාෂාවේ අංක භාවිත කරමින් තමාට සමීප දේවල් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

8.1 ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- ජපානයේ පාසල් මට්ටම් 3 ජපන් බසින් නම් කරයි
- තමා ඉගෙන ගන්නා ශ්‍රේණිය ජපන් බසින් ප්‍රකාශ කරයි.
- අන්‍යයන් ඉගෙනුම ලබන ශ්‍රේණි විමසා දැන ගනියි.
- ජපානයේ ප්‍රාථමික, ද්වීතියික සහ උසස් පාසල්වලට අයත් වන ශ්‍රේණි ජපන් බසින් පවසයි..
- ශ්‍රී ලංකාවේ පාසල්වල එක් එක් ශ්‍රේණියන්ට අනුව එම ශ්‍රේණිය ජපානයේ කුමන පාසල් මට්ටමේ කුමන ශ්‍රේණියට සමානදැයි පවසයි.
- ජපානයේ පාසල්වල ඇති පහසුකම් පිළිබඳ ව මවු බසින් විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ සහ ජපානයේ ශිෂ්‍යයන්ගේ පාසල් ජීවිතය සසඳමින් මවු බසින් අදහස් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ජපානයේ ප්‍රාථමික, ද්වීතීයික සහ උසස් යනුවෙන් පාසල් මට්ටම් 3කි
  - ප්‍රාථමික පාසල (වසර 6 )
  - ද්වීතියික පාසල (වසර 3 )
  - උසස් පාසල (වසර 3 )
- අනිවාර්ය අධ්‍යාපනය වසර 9 කි ( ද්වීතීයික පාසල් අධ්‍යාපනය අවසන් වන තෙක්)
- ද්වීතියික පාසලේ සිට උසස් පාසලට ඇතුළත් වීම සඳහා ඇතුලත් වීමේ විභාගයකට පෙනී සිටිය යුතුය
- ජපානයේ බොහෝ පාසල් මිශ්‍ර පාසල් වේ.
- රජයේ පාසල් සහ පෞද්ගලික පාසල් ඇත.
- අප්‍රේල් 02 වන දිනට අවුරුදු 06 සම්පූර්ණ වන ළමුන් ප්‍රාථමික පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 1**

- ප්‍රාථමික, ද්වීතියික සහ උසස් වශයෙන් ජපානයේ පාසල් මට්ටම් සහ ඊට අයත් ශ්‍රේණි කවරේදැයි විස්තර කරන්න.
- ජපානයේ පාසල් ක්‍රමය පිළිබඳ ව ශිෂ්‍යයන් දන්නා කරුණු ඇසුරින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඡායාරූප, රූප සටහන් ඩී.වී.ඩී සහ දෘෂ්‍ය මාධ්‍යය ඇසුරින් ජපානයේ පාසල්වල පහසුකම්, පාසල් දින දර්ශනය, කාල සටහන, සහ නිල ඇඳුම් ආදී දේ පිළිබඳ ව ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ පාසල් ජීවිතය පිළිබඳ ව පැහැදිලි කරමින් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ගේ පාසල් ජීවිතය සමග සැසඳීමට අවස්ථාවක් ලබා දෙන්න.
- ජපානයේ සංස්කෘතිය පිළිබඳ පොත් පිංචක් සකස් කිරීමේ පළමු පියවර වශයෙන් ශිෂ්‍යයන් උගත් කරුණු ගොනු කර සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.

**පියවර 2**

- ඉගෙනුම ලබන ශ්‍රේණිය ජපන් බසින් ප්‍රකාශ කරන වාක්‍ය රටාව හඳුන්වා දෙන්න.
- අන්‍යයන්ගේ ශ්‍රේණිය විමසමින් සටහන් කර ගැනීමට සහ සංවාද ගොඩ නැගීමට උපදෙස් දෙන්න.
- ජපානයේ පාසල් මට්ටම් සහ ශ්‍රේණිවලට අනුව තමන් ඉගෙනුම ලබන ශ්‍රේණිය ප්‍රකාශ කරන ආකාරය පැහැදිලි කරන්න.
- දෙරටේ සමාන්තර ශ්‍රේණි ජපන් බසින් හඳුන්වන ආකාරය සඳහන් වගුවක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත - 3 පාඩම
- ජපානයේ පාසල් පිළිබඳ ව තොරතුරු ඇතුළත් පොත්, සඟරා, පින්තූර
- සී.ඩී තැටි හා ඩී.වී.ඩී. තැටි

**තක්සේරුව හා ඇගයීම**

- දෙරටේ පාසල් ක්‍රමයේ  සමාන අසමානතා විස්තර කරයි.
- තමා හා අන් අය ඉගෙනුම ලබන ශ්‍රේණි ජපන් බසින් ප්‍රකාශ කරයි.
- ජපානයේ පාසල් මට්ටම් හා ශ්‍රේණි නම් කර සටහන් කරයි.
- ජපානයේ පාසල් සහ පහසුකම් පිළිබඳ ව තොරතුරු රැස්කරයි.

**ඒකකය 07**

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියාකාරකම් පිළිබඳ ව ජපන් බසින් ප්‍රකාශ කරයි.
04 තම අවශ්‍යතා, ප්‍රිය කරන දේවල්, දෛනික කටයුතු පිළිබඳ ව ලියයි.
07 ජපන් භාෂාව හා බැඳුණු ජපන් සංස්කෘතික ආචාර ධර්ම, සමාජ චර්යාකම් හඳුනා ගනියි.
08 ජපන් සමාජය හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

2.1 තමා ව හඳුන්වා දෙයි.
4.1. සරල ජපන් බසින් තමා පිළිබඳ ව හැඳින්වීමක් ලියයි.
7.3. අවස්ථානුකූලව සුදුසු ලෙස පුද්ගලයින් ආමන්ත්‍රණය කරයි.
8.1. ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනාගෙන අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 05 යි.**

**ඉගෙනුම් පල**

- තමන් පදිංචි ස්ථානය ජපන් බසින් පවසයි.
- පදිංචි ස්ථානය පිළිබඳ ව අන්‍යයන්ගෙන් විමසා දැනගනියි.
- ශ්‍රී ලංකාවේ නගර හා ප්‍රදේශවල නම් ජපන් බසින් උච්චාරණය කරන ආකාරය හඳුනා ගෙන ඒ අනුව උච්චාරණය කරයි.
- විදේශ රටවල නම් සහ ප්‍රසිද්ධ නගරවල නම් ජපන් බසින් උච්චාරණය කර ලියයි.
- ලෝකයේ රටවල් සහ ප්‍රසිද්ධ නගර නාමයන් උච්චාරණය කරන ආකාරය සවන් දී සටහන් කරයි.
- තම පවුලේ සාමාජිකයන් ආමන්ත්‍රණය කිරීමේ දී භාවිත කළ යුතු පද හඳුනාගෙන භාවිත කරයි.
- පිටස්තර පුද්ගලයන්ගේ පවුලේ සාමාජිකයන් හඳුන්වන පද හඳුනා ගෙන සුදුසු ආමන්ත්‍රණ පද භාවිත කර ආමන්ත්‍රණය කරයි.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ පවුල සහ පවුල් සබඳතා පිළිබඳ ව සසඳමින් මව් බසින් විස්තර කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- විදේශ රටවල සහ ප්‍රදේශවල නම් කතකනා හෝඩිය භාවිත කර ලිවීම.
- " චීනය" , " කොරියාව" ආදී කන්ජි අක්ෂර භාවිත වන රටවල නම් හිරගනා අක්ෂරවලින් ලිවීම.
- ශ්‍රී ලංකාවේ ප්‍රදේශ වල නම් ජපන් භාෂාවේ උච්චාරණයට අනුකූල ව සකස් කර ගත යුතු ය. ප්‍රධාන නගරවල නම් පහත නම් සඳහන් පරිදි ලිවිය යුතුයි.
  - කොළඹ Koronbo මීගමුව Nigambo
  - නුවර Kyandi ගාල්ල Goru
  - ත්‍රිකුණාමලය Torinkomalei යාපනය Jafuna
- තම පවුලේ සාමාජිකයන් හැඳින්වීමේ දී සහ වෙනත් පවුලක සාමාජිකයන් හැඳින්වීමේ දී භාවිත කරන ආමන්ත්‍රණ පද වෙනස් වේ.
- පවුල තුළ තමාට වඩා බාල සාමාජිකයන් නමින් ආමන්ත්‍රණය කරන අතර වැඩිමහලු සහෝදර, සහෝදරියන් "Oni san" " One san "ලෙස ආමන්ත්‍රණය කරයි.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 1**

- විදේශ භාෂාවලින් එන වචන ජපන් භාෂාවට යොදා ගැනීමේ දී අනුගමනය කළ යුතු නීති සමුදාය හඳුන්වා දෙන්න. උදාහරණ :- ස්වර, ව්‍යඤ්ජන සම්බන්ධ වන ආකාරය
- ශිෂ්‍යයන් කිහිපදෙනෙකු ගෙන් ජීවත්වන ප්‍රදේශය පිළිබඳ ව විමසා කළු ලෑල්ලේ සටහන් කරන්න
- ජපන් උච්චාරණ ක්‍රමයට අනුව ජපන් බසින් එම ප්‍රදේශ නාම හඳුන්වන ආකාරය උදාහරණ සහිත ව විස්තර කර එම ප්‍රදේශවල නම් හඬ නගා උච්චාරණය කිරීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ලෙස රටවල නම් සහ ප්‍රදේශවල නම් ලැයිස්තු ගත කර ජපන් බසින් හඳුන්වන ආකාරය ලිවීමට උපදෙස් දෙන්න.

**පියවර 2**

- තමන් පදිංචි ප්‍රදේශය ජපන් බසින් ප්‍රකාශ කිරීමට අවශ්‍ය වාක්‍ය රටා හඳුන්වා දෙන්න.
- ශිෂ්‍යයන් පදිංචි ප්‍රදේශ විමසමින් පිළිතුරු ලබා ගන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් වශයෙන් වෙන් වී පදිංචි ප්‍රදේශ පිළිබඳ ව එකිනෙකාගෙන් ප්‍රශ්න අසමින් පිළිතුරු සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.

**පියවර 3**

- ශ්‍රී ලාංකිකයන් තම පවුලේ සාමාජිකයින්, සමීප ඥාතීන් සහ වෙනත් පවුල් වල සාමාජිකයන් හඳුන්වන ආකාරය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ජපානයේ පවුල්වල සාමාජිකයන් හඳුන්වන පද හඳුන්වා දෙන්න.
- පවුලේ සාමාජිකයන් හා වෙනත් පවුල්වල සාමාජිකයන් හැඳින්වීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු සාකච්ඡා කරන්න.
- ජපානයේ පවුල් සහ පවුල් සබඳතා පිළිබඳ ව පැහැදිලි කර ශ්‍රී ලංකාවේ පවුල් ඒකකය සමග සසඳමින් සාකච්ඡාවක නිරතවන්න.
- ජපානයේ පවුල් ඒකකය පිළිබඳ ව උගත් කරුණු ගොනුකර සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත - 4 පාඩම සහ 22 පාඩම
- පවුලේ ඡායාරූප / පින්තූර

**තක්සේරුව හා ඇගයීම**

- තමන් පදිංචි ප්‍රදේශය ජපන් බසින් ප්‍රකාශ කරයි.
- පවුලේ සාමාජිකයන් ජීවත් වන ප්‍රදේශය පවසයි.
- වෙනත් පවුල්වල සාමාජිකයන් ජීවත් වන ප්‍රදේශය පිළිබඳ ව ප්‍රශ්න අසා පිළිතුරු ලබා ගනියි.
- දෙරටේ පවුල් සබඳතා අතර ඇති සමාන අසමානතා පිළිබඳ ව මවු බසින් ප්‍රකාශ කරයි.

**ඒකකය 08**

**නිපුණතාව**

03 ප්‍රිය කරන දේවල් පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරමින් අන්‍යයන් සමග අදහස් හුවමාරු කර ගනියි.

08 ජපන් සමාජය හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

3.2 තම විනෝදාංශ පිළිබඳ ව ප්‍රකාශ කරමින් අදහස් හුවමාරු කර ගනියි.

8.1. ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 04 යි.**

**ඉගෙනුම් පල**

- තම විනෝදාංශ පිළිබඳ ව කියයි.
- අන්‍යයන්ගේ විනෝදාංශ පිළිබඳ ව විමසා දැන ගනියි.
- ජපන් ජාතික යෞවනයන්ගේ විනෝදාංශ මවු බසින් විස්තර කරයි.
- ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ මිත්‍ර සබඳතා, ප්‍රිය කරන දේ, දෛනික කටයුතු සහ ඔවුන්ගේ විවේකය ගත කරන ආකාරය පිළිබඳ ව මවු බසින් පැහැදිලි කරයි.
- දෙරටේ ශිෂ්‍යයන්ගේ විනෝදාංශ සහ ප්‍රිය කරන දේ පිළිබඳ ව සසඳමින් මවු බසින් අදහස් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ජපන් ජාතික ශිෂ්‍යයන් විවේකය ගත කරන ආකාරය
- ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ විනෝදාංශ
- ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ දෛනික ක්‍රියාකාරකම්

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 1**

- ශිෂ්‍යයන්ගේ විනෝදාංශ සහ විවේක කාලය ගත කරන ආකාරය පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සම වයසේ ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ විනෝදාංශ, මිත්‍ර සබඳතා, සිතුම් පැතුම් සහ විවේකය ගත කරන ආකාරය පෙළ පොත ආශ්‍රිත ව විස්තර කරන්න.
- දෙරටේ ශිෂ්‍යයන්ගේ විනෝදාංශ සසඳමින් අදහස් පැවසීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ දෛනික කටයුතු, විනෝදාංශ සහ මිත්‍ර සබඳතා පිළිබඳ තොරතුරු සොයා සටහනක් පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.

**පියවර 2**

- ජපන් බසින් විනෝදාංශය විමසන හා පවසන වාක්‍ය රටා සහ විශේෂිත වචන හඳුන්වා දෙන්න.
- විනෝදාංශ සඳහන් පින්තූර කාඩ්පත් පෙන්වා ජපන් බසින් විනෝදාංශ හඳුන්වා දෙන්න.
- පන්තියේ එක් එක් ශිෂ්‍යයන්ගෙන් විනෝදාංශය විමසමින් පිළිතුරු ලබා ගන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට වෙන්කර මිතුරන්ගේ විනෝදාංශ අසා සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- තම පවුලේ සියලු ම සාමාජිකයන්ගේ විනෝදාංශ පිළිබඳ ව ජපන් බසින් සටහන් කර ගෙන ඒමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත - 5 පාඩම සහ 21 පාඩම
- පින්තූර කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- තමාගේ, පවුලේ සාමාජිකයින්ගේ සහ මිතුරන්ගේ විනෝදාංශ ජපන් බසින් ප්‍රකාශ කරයි.
- අන්‍යයන්ගේ විවිධ විනෝදාංශ විමසා දැන ගනියි.
- සම වයසේ ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ විනෝදාංශ සහ දෛනික කටයුතු පිළිබඳ ව තොරතුරු ඩ ස් කරයි.
- දෙරටේ සම වයසේ සිසුන්ගේ විනෝදාංශ, සිතුම් පැතුම්, ක්‍රියාකාරකම් පිළිබඳව මවු බසින් අදහස් ප්‍රකාශ කරයි.

## ඒකකය 09

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියාකාරකම් පිළිබඳව ජපන් බසින් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම**

2.2 ජපන් භාෂාවේ අංක භාවිත කරමින් තමාට සමීප දේවල් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- වෙලාව හැඳින්වීම සඳහා යොදන "ji " යෙදුම භාවිත කරමින් 1-12 දක්වා වේලාව ප්‍රකාශ කරයි.
- විනාඩි හැඳින්වීම සඳහා යොදන "fun" යෙදුම භාවිත කරමින් විනාඩි 5,10,15 වශයෙන් වේලාව ප්‍රකාශ කරයි.
- පැය භාගය හැඳින්වීම සඳහා යොදන "han" යෙදුම භාවිත කරමින් 1.30, 2.30.... වශයෙන් වේලාව ප්‍රකාශ කරයි.
- අන්‍යයන්ගෙන් වේලාව විමසා දැන ගනියි.
- පැය 12 සහ 24 ක්‍රම 2කටම අනුව වේලාව ප්‍රකාශ කරයි.
- සවන් දී වේලාව අවබෝධ කර ගනී.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- "ji"," fun", "han "යන පසු යෙදුම්වල භාවිතය
- විවිධ ක්‍රම ඇසුරින් වේලාව පැවසීම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 1**

- පැය හැඳින්වීම සඳහා යොදන පසු යෙදුම සහ "ji" භාවිත කරමින් 1 12 දක්වා වෙලාව ප්‍රකාශ කරන ආකාරය හඳුන්වා දෙන්න.
- වේලාව සඳහන් කරන ලද කාඩ්පත් පෙන්වමින් නිවැරදි වේලාව පැවසීමට ශිෂ්‍යයන්ට අවස්ථාව දෙන්න.
- විනාඩි හැඳින්වීම සඳහා යොදන පසු යෙදුම "fun" සහ "han" භාවිත කරමින් වෙලාව ප්‍රකාශ කරන ආකාරය හඳුන්වා දෙන්න.
- වේලාව සඳහන් කරන ලද ඔරලෝසු මුහුණත් සහිත රූප කාඩ්පත් පෙන්වමින් සිසුන්ගෙන් වේලාව විමසා පිළිතුරු ලබාගන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත - 6 පාඩම
- ඔරලෝසු මුහුණත සහිත පින්තූර කාඩ්පත්
- විශාල ප්‍රමාණයේ ඔරලෝසු මුහුණතක් (පන්තියේ ශිෂ්‍යයන් සියලු ම දෙනාට පැහැදිලි ව පෙනෙන ප්‍රමාණයට සකස් කරන ලද)

**තක්සේරුව හා ඇගයීම**

- විනාඩි ගණන ඇතුළත් ව නිවැරදි ව වෙලාව ප්‍රකාශ කරයි.
- පෙරවරු සහ පස්වරු වශයෙන් වේලාව ප්‍රකාශ කරයි.
- පෙරවරු /පස්වරු වශයෙන් සඳහන් කර ඇති වේලාව පැය 24 ඔරලෝසුවෙන් පවසයි.

**ඒකකය 10**

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියකාරකම් පිළිබඳව ජපන් බසින් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම**

2.1 තමා ව හඳුන්වා දෙයි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- තම සහෝදර සහෝදරියන් පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- වෙනත් කෙනෙකුගේ සහෝදර සහෝදරියන් පිළිබඳව විමසා දැන ගනියි.
- තම පවුලේ සහෝදර සහෝදරියන් සහ මිතුරන්ගේ සහෝදර සහෝදරියන් හඳුන්වාදීමේදී සහ ආමන්ත්‍රණයේ දී නිවැරදි පද භාවිත කරයි.
- සහෝදර සහෝදරියන් පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ජපන් පවුලක දරුවන් හඳුන්වන ආකාරය
  - වැඩමහලු ගැහැණු ළමයා chojo
  - වැඩිමහලු පිරිමි ළමයා chonan
  - දෙවන ගැහැණු ළමයා jijo
  - දෙවන පිරිමි ළමයා jinan
  - පවුලේ බාලයා suekko
- "kyodai "යනුවෙන් සහෝදර සහෝදරියන් හැඳින්වීමට භාවිත කළ හැකි වුවත් "shimai" භාවිත කරන්නේ සහෝදරියන් සඳහා පමණයි.
- සහෝදර සහෝදරියන් ආමන්ත්‍රණය කරන ආකාරය

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 1**

- පවුලක ඡායාරූපයක් හෝ පින්තූරයක් පෙන්වා පවුලේ සාමාජිකයන් හඳුන්වා දෙන්න.
- සහෝදර සහෝදරියන් සිටිනවා ද කියා එක් එක් ශිෂ්‍යයාගෙන් විමසමින් 'ඔව්'/ 'නැත' ලෙස ජපන් බසින් පිළිතුරු ලබා ගන්න.
- සහෝදර සහෝදරියන් සිටින්නේ නම් පිළිතුරු ලබාදෙන ආකාරය අදාළ වාක්‍ය රටා ඇසුරෙන් ශිෂ්‍යයන්ට පුහුණු කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර යහළුවන්ගෙන් සහෝදර සහෝදරියන් පිළිබඳ ව විමසා සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- යහළුවන්ගේ සහෝදර සහෝදරියන් පිළිබඳ කෙටි විස්තරයක් කිරීමට අවස්ථාව දෙන්න.
- මෙතෙක් උගත් කරුණු ඇසුරින් තමා හා තම පවුල පිළිබඳ ව කෙටි විස්තරයක් ලිවීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත - 7 පාඩම
- පවුලක ඡායාරූපයක් / පින්තූර කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- අන්‍යයන්ගේ සහෝදර සහෝදරියන් පිළිබඳ ව විමසා දැනගනියි.
- තමාගේ සහ යහළුවන්ගේ සහෝදර සහෝදරියන් පිළිබඳ ව කෙටියෙන් ලියයි.
- තම පවුලේ ඡායාරූපයක් පෙන්වා පවුලේ සාමාජිකයින් හඳුන්වා දී විස්තර කරයි.

**ඒකකය 11**

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියකාරකම් පිළිබඳ ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

05 සරල ජපන් බසින් ලියැවුණු තොරතුරු කියවා අවබෝධ කර ගනියි.

06 එදිනෙදා ජීවිතයට අවශ්‍ය සරල තොරතුරුවලට සවන් දී අවබෝධ කර ගනියි.

08 ජපන් සමාජය හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

2.3 තම දෛනික කාර්යයන් පිළිබඳ ව සරල ව ප්‍රකාශ කරයි.

5.1 ජපන් භාෂාවෙන් ලියූ කාල සටහන්, දින දර්ශන, මෙනුපත් ආදිය කියවා අවබෝධ කර ගනියි.

6.2 දෛනික ජීවිතයට අවශ්‍ය උපදෙස් සහ තොරතුරුවලට සවන් දී අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

8.1. ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 04 යි.**

**ඉගෙනුම් පල**

- සතියේ දින පිළිවෙළින් ජපන් බසින් ප්‍රකාශ කරයි.
- පාසැලේ දී තමා ඉගෙනුම ලබන විෂයයන් හඳුන්වා දෙයි.
- පන්ති කාල සටහන පිළිබඳ ව තොරතුරු සරල ව ප්‍රකාශ කරයි
- යහළුවන් ඉගෙනුම ලබන විෂයයන් හා දින පිළිබඳ ව විමසා දැන ගනියි.
- පාසල් කාල සටහන පිළිබඳ විමසමින් සහ පැහැදිලි කරමින් සරල සංවාද ගොඩ නගයි.
- ජපන් බසින් ලියූ පන්ති කාල සටහන කියවා අවබෝධ කර ගෙන සරල ව විස්තර කරයි.
- සරල ජපන් බසින් ඉදිරිපත් කරන ලද කාල සටහනේ අඩංගු තොරතුරුවලට සවන් දී අවබෝධ කර ගෙන සටහන් කරයි.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ සමාන්තර ශ්‍රේණිවල ශිෂ්‍යයන් ඉගෙන ගන්නා විෂයයන් හා පන්ති කාල සටහන පිළිබඳ ව සසඳමින් මවු බසින් අදහස් ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සතියේ දින
- ජපානයේ ශිෂ්‍යයන්ගේ කාල සටහන හා විෂයයන්

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- දින දර්ශනයක් හෝ සතියේ දින ලියන ලද කාඩ්පත් භාවිත කරමින් සතියේ දින ජපන් බසින් හඳුන්වා දෙන්න.
- හඬ නගා කියවමින් ශිෂ්‍යයන්ට පුහුණුවන්න අවස්ථාව දෙන්න.
- විවිධ විෂයයන්ට අදාළ ව සකසන ලද රූප කාඩ්පත් පෙන්වමින් ජපන් බසින් විෂයයන් හඳුන්වා දෙන්න.
- අදාළ වාක්‍ය රටා ඇසුරින් එක් එක් දිනයන් හි දී ඉගෙනුම ලබන විෂයයන් පිළිබඳ ව යහළුවන්ගෙන් විමසා පිළිතුරු ලබා ගෙන සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- කාල පරිච්ඡේදයක් ජපන් බසින් හඳුන්වන ආකාරය විස්තර කර සකස් කරන ලද පන්ති කාල සටහනක් ඇසුරින් කාල සටහනෙහි අඩංගු තොරතුරු පිළිබඳ විමසමින් පිළිතුරු ලබා ගන්න.
- ශ්‍රී ලංකාවේ සහ ජපානයේ සමවයසේ ශිෂ්‍යයන් ඉගෙන ගන්නා විෂයයන් සහ කාල සටහන පිළිබඳ තොරතුරු සසඳමින් සාකච්ඡාවක නිරත වන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත 8 පාඩම සහ 24 පාඩම
- දින දර්ශනය, පන්ති කාල සටහන

**තක්සේරුව හා ඇගයීම**

- සතියේ දවස් පිළිවෙළින් මතකයෙන් කියයි, ලියයි.
- ඉගෙනුම ලබන විෂයයන් ජපන් බසින් පවසයි.
- කාල සටහන කියවා අවබෝධ කර ගනියි.
- සරල සංවාද ගොඩ නගයි.

## ඒකකය 12

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියාකාරකම් පිළිබඳව ජපන් බසින් ප්‍රකාශ කරයි.

05 සරල ජපන් බසින් ලියැවුණු තොරතුරු කියවා අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

2.3 තම දෛනික කාර්යයන් පිළිබඳ සරල ව ප්‍රකාශ කරයි.

5.1 ජපන් භාෂාවෙන් ලියූ කාල සටහන්, දින දර්ශන, මෙනු පත් ආදිය කියවා අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- යම් කාර්යයක් ආරම්භ කරන වේලාව සහ අවසන් කරන වේලාව ප්‍රකාශ කරයි.
- පාසල් කාල සටහන හා එහි විෂයයන් ඉගෙන ගන්නා කාලසීමාව ප්‍රකාශ කරයි.
- කාල සටහනට අනුව ඒ ඒ විෂයයන් ඉගෙන ගන්නා කාල සීමාව පිළිබඳ මිතුරන්ගෙන් විමසමින් සංවාද ගොඩ නගයි.
- ජපානයේ ශිෂ්‍යයන් ඉගෙන ගන්නා විෂයයන් සහ කාල සටහන් පිළිබඳ තොරතුරු මවු බසින් පවසයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- "Kara" ," made" භාවිතය
- ජපන් ජාතික ශිෂ්‍යයන් ඉගෙනුම ලබන විෂයන්වල විශේෂතා හා හැදෑරිය යුතු අනිවාර්ය විෂයන්
- ජපානයේ පාසල් පවත්වනු ලබන වේලාව පිළිබඳ අවබෝධය

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- "kara" , "made " භාවිත කර වාක්‍ය ගොඩ නගන ආකාරය නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.
- වේලාවන් දෙකක් සටහන් කරන ලද කාඩ්පත් පෙන්වමින් "kara" / "made" භාවිතය පුහුණු කරන්න.
- පන්ති කාල සටහන ඇසුරින් එක් එක් විෂයය ඉගෙනුම ලබන වෙලාව විමසමින් ශිෂ්‍යයන්ගෙන් පිළිතුරු ලබා ගන්න. සංවාද ගොඩ නැගීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
- ජපානයේ ශිෂ්‍යයන් ඉගෙන ගන්නා විෂයයන් හා කාල සටහන පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත - 9 පාඩම
- වේලාව ඉලක්කමෙන් ලියූ කාඩ්පත්
- විශාල ව ලියූ පන්ති කාල සටහන

**තක්සේරුව හා ඇගයීම**

- කාල සටහනේ සඳහන් එක් එක් විෂයය ඉගෙනුම ලබන කාල සීමාව සහ දිනය ජපන් බසින් ප්‍රකාශ කරයි.
- ගුරුවරයා පවසන විෂය, දිනය සහ කාල පරාසවලට සවන් දී සටහන් කරයි.
- ජපානයේ ශිෂ්‍යයන්ගේ කාල සටහන පිළිබඳ ව අදහස් මවු බසින් පවසයි.
- කාල සටහනේ තොරතුරු ඇසුරින් සරල සංවාද ගොඩ නගයි.

**ඒකකය 13**

**නිපුණතාව**

03 ප්‍රිය කරන දේවල් පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරමින් අන්‍යයන් සමඟ අදහස් හුවමාරු කර ගනියි.

**නිපුණතා මට්ටම**

3.1. තමා ප්‍රිය කරන දේවල් පිළිබඳ ව ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- විවිධ ආහාර වර්ගවල නම් ජපන් බසින් කියයි.
- තමා ප්‍රිය කරන ආහාර පාන පිළිබඳ ව ජපන් බසින් ප්‍රකාශ කරයි.
- වෙනත් අය ප්‍රිය කරන ආහාර පාන පිළිබඳ ව විමසා දැන ගනියි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ..... ga suki desu
- Donna ......... ga suki desuka ? වාක්‍ය රටා හඳුන්වාදීම
- විවිධ ආහාර පානවල නම් ජපන් බසින් හඳුන්වාදීම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ශිෂ්‍යයන් ප්‍රිය කරන ආහාර පාන පිළිබඳ ව විමසමින් විවිධ ආහාර වර්ගවල නම් ජපන් බසින් හඳුන්වා දෙන්න
- එම ආහාරවලට ප්‍රිය කරන බව ප්‍රකාශ කරන ආකාරය සංවාද ඇසුරින් පුහුණු කරවන්න.
- කැමති ආහාර පිළිබඳ පන්තියේ මිතුරන්ගෙන් විමසීමට සහ පිළිතුරු ලබා ගැනීමට සිසුන්ව යොමු කරන්න.
- ශ්‍රී ලංකාවට ආවේනික ආහාරවල නම් ජපන් බසින් හඳුන්වා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත - 10 පාඩම
- විවිධ කෑම වර්ග පිළිබඳ දැන්වීම් පත්‍රිකා, රූප කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- තමා ප්‍රිය කරන ආහාරපාන පිළිබඳ ව ජපන් බසින් ප්‍රකාශ කරයි.
- අන්‍යයන් ප්‍රිය කරන ආහාර පිළිබඳ ව විමසමින් සහ පිළිතුරු දෙමින් සරල සංවාද ගොඩ නගයි.
- ශ්‍රී ලංකාවට ආවේණික ආහාර වර්ගවල නම් ජපන් බසින් ලියයි.

## ඒකකය 14

**නිපුණතාව**

03 ප්‍රිය කරන දේවල් පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරමින් අන්‍යයන් සමග අදහස් හුවමාරු කර ගනියි.

**නිපුණතා මට්ටම**

3.3 යම් ස්ථානයක ඇති භාණ්ඩ හඳුනා ගෙන ඒවායෙහි පිහිටීම පිළිබඳ ව විස්තර කරයි.

**කාලච්ඡේද 02 යි.**

**ඉගෙනුම් පල**

- තම කාමරයේ තබා ඇති භාණ්ඩ ජපන් බසින් හඳුන්වයි.
- කාමරයේ තබා ඇති භාණ්ඩ පිළිබඳ ව අන්‍යයන්ගෙන් විමසා දැන ගනියි.
- ඒ පිළිබඳ ව සරල සංවාද ගොඩනගයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ..... no........ ni............ nani ga arimasu ka
- ........... ya ........ ya.......ga arimasu යන වාක්‍ය රටා හඳුන්වාදීම.
- විවිධ භාණ්ඩ සහ උපකරණ ජපන් බසින් හඳුන්වා දීම.
- ''සම්ප්‍රදායික ජපන් කාමර" සහ "බටහිර පන්නයේ කාමර" පිළිබඳ ව හඳුන්වාදීම.
- ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ කාමර තුළ කාටුන් පොත්, රූපවාහිනී, පරිගණක යනාදිය දක්නට ඇත.
- ඇඳ වෙනුවට නිදාගැනීම සඳහා "Futon" යනුවෙන් හැඳින්වෙන ජපන් පන්නයේ ඇඳ ඇතිරිල්ල භාවිත කරන ජපන් ජාතිකයින් ද සිටී.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- කාමරයක් තුළ ඇති විවිධ භාණ්ඩ සහ උපකරණ සහිත රූප කාඩ් පත් පෙන්වමින් එම භාණ්ඩ සහ උපකරණ ජපන් බසින් හඳුන්වා දෙන්න.
- අදාළ වාක්‍ය රටා හඳුන්වා දී කාමරයේ ඇති උපකරණ පිළිබඳ ව විමසා පිළිතුරු ලබාගන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර යහළුවන්ගේ නිදන කාමරයේ ඇති භාණ්ඩ පිළිබඳ ව විමසමින් එම පිළිතුරු සටහන් කර ගැනීමට පවසන්න.
- තම සටහනේ අඩංගු තොරතුරු අසුරින් යහළුවන්ගේ කාමරයේ ඇති භාණ්ඩ පිළිබඳ ව වාක්‍ය කිහිපයක් පන්තිය ඉදිරියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- පාඩමේ අන්තර්ගතය ඇසුරින් සරල සංවාද ගොඩ නගමින් පුහුණු වීමට අවස්ථාව දෙන්න.
- විවිධ භාණ්ඩ ඇතුළත් කාමරයක චිත්‍රයක්/රූප සටහනක් ඇසුරින් ප්‍රශ්න අසමින් පිළිතුරු ලබා ගන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත - 11 පාඩම
- රූප කාඩ්පත්
- කාමරයක ඡායාරූපයක් /චිත්‍රයක්

**තක්සේරුව හා ඇගයීම**

- විවිධ භාණ්ඩ සහ උපකරණ හඳුන් වන නම් ජපන් බසින් කියයි
- තම කාමරයේ තිබෙන භාණ්ඩ නම් කරයි.
- සරල සංවාද ගොඩ නගයි.

**ඒකකය 15**

**නිපුණතාව**

03 ප්‍රිය කරන දේවල් පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරමින් අන්‍යයන් සමග අදහස් හුවමාරු කර ගනියි.

08 ජපන් සමාජය හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

3.1. තමා ප්‍රිය කරන දේවල් පිළිබඳ ව ප්‍රකාශ කරයි.

8.1. ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 04 යි.**

**ඉගෙනුම් පල**

- සංචාරය කිරීමට ප්‍රියකරන ස්ථාන පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- වෙනත් අය සංචාරය කිරීමට ප්‍රිය කරන ස්ථාන පිළිබඳ ව විමසා දැන ගනියි.
- ශ්‍රී ලංකාවේ සහ ජපානයේ සංචාරකයින්ගේ ආකාර්ශනයට ලක් වූ ස්ථාන පිළිබඳ අවබෝධයක් ලබාගෙන මවු බසින් පැහැදිලි කරයි.
- සංචාරයක දී පිළිපැදිය යුතු ආචාර ධර්ම විස්තර කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පහත සඳහන් වාක්‍ය රටා
  Doko e ikitai desuka.
  ........... e ikitai desu. යන වාක්‍ය රටා හඳුන්වාදීම.
- ජපානයේ ප්‍රධාන දූපත් සතර සහ එම දූපත්වල ප්‍රධාන සංචාරක ස්ථාන සහ එහි වැදගත්කම පිළිබඳ ව තොරතුරු
  - හොක්කයිදෝ, හොන්ෂූ, ෂිකොකු, ක්යූෂු
  - ක්යෝතෝ, හිරොෂිමා, සප්පොරෝ, තෝකියෝ

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ජපානයේ සිතියමක් ඇසුරින් ජපානයේ ප්‍රධාන දූපත් සහ ප්‍රධාන සංචාරක නගර හඳුන්වා දෙන්න.
- එක් එක් නගරවල සුවිශේෂතා පිළිබඳ ඡායාරූප/ වීඩියෝ පට/පින්තූර ඇසුරින් පැහැදිලි කරන්න.
- දෙරටේ සංචාරකයින් සංචාරයක දී පිළිපදින සහ පිළිපැදිය යුතු ආචාර ධර්ම පිළිබඳ සන්සන්දනාත්මක සාකච්ජාවක නිරත වන්න.
- ජපානයේ සංචාරක ස්ථාන පිළිබඳ තොරතුරු එක් රැස්කර වාර්තාවක් පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.
- අදාළ වාක්‍ය රටා ඇසුරින් ශිෂ්‍යයන් යාමට ප්‍රිය කරන ස්ථාන පිළිබඳ විමසමින් වාක්‍ය ගොඩ නැගීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් වශයෙන් වෙන් කර එකිනෙකා යාමට ප්‍රිය කරන ස්ථාන පිළිබඳ ව විමසමින් සරල සංවාද ගොඩ නැගීමට උපදෙස් දෙන්න.
- එක් එක් කණ්ඩායමට තම සංවාද ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පොළපොත - 12 පාඩම සහ 26 පාඩම
- ජපානයේ සිතියමක්, ජපානයේ සංචාරක ස්ථාන පිළිබඳ ඡායාරූප, වීඩියෝ පට
- ශ්‍රී ලංකාවේ සිතියමක් සහ ලෝක සිතියමක්

**තක්සේරුව හා ඇගයීම**

- ජපානයේ සුවිශේෂී සංචාරක ස්ථාන පිළිබඳ ව තොරතුරු රැස් කරයි.
- සංචාරකයින් වශයෙන් පිළිපැදිය යුතු ආචාර ධර්ම පිළිබඳ ව විස්තර කරයි.
- තමා යාමට ප්‍රිය කරන ස්ථාන පිළිබඳ ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

**ඒකකය 16**

**නිපුණතාව**

03 ප්‍රිය කරන දේවල් පිළිබඳව අදහස් ප්‍රකාශ කරමින් අන්‍යයන් සමග අදහස් හුවමාරු කර ගනියි.

08 ජපන් සමාජය හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

3.1. තමා ප්‍රිය කරන දේවල් පිළිබඳ ව ප්‍රකාශ කරයි.

8.1. ශ්‍රී ලංකාවේ සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනාගෙන එම අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 4 යි.**

**ඉගෙනුම් පල**

- ජපන් ආහාර පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගෙන දේශීය ආහාර සමග සසඳමින් මවු බසින් අදහස් ප්‍රකාශ කරයි.
- ජපානයේ ප්‍රධාන ආහාර සහ /ජනප්‍රිය ආහාර නම් කරයි.
- ජපන් ජාතිකයින් ආහාර ගැනීමේ දී අනුගමනය කරන සිරිත් විරිත් හඳුනා ගෙන ශ්‍රී ලංකාව සමග සසඳයි.
- තමන් මෙතෙක් රසවිඳ නොමැති ආහාරයක් නම් කර එය රස බැලීමට කැමති බව ප්‍රකාශ කරයි.
- අන්‍යයන් රස බැලීමට ප්‍රියකරන ආහාර පිළිබඳ ව විමසා දැන ගනියි.
- එකිනෙකා මෙතෙක් රස විඳ නොමැති එහෙත් අළුතෙන් රස බැලීමට ප්‍රිය කරන ආහාර පිළිබඳ ව විමසමින් සරල සංවාද ගොඩ නගයි.
- අවන්හලක දී ආහාර ඇනවුම් කිරීම සඳහා අවශ්‍ය සංවාද ගොඩ නගයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- බහුල ව රස විඳීමට නො ලැබෙන සුවිශේෂි දේශීය ආහාර වර්ග සහ විදේශීය ආහාර වර්ග ජපන් බසින් හඳුන්වාදීම.
- ජපන් ආහාර වර්ග
- දෙරටේ ආහාර ගන්නා ක්‍රම හා පිළිපදින සිරිත් විරිත්
- දෙරටේ ආහාරවල සමාන අසමානතා

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- බහුල ව රසවිඳීමට නොලැබෙන දේශීය ආහාරවල පින්තූර පෙන්වා එම ආහාර රසවිඳ තිබේදැයි විමසමින් පාඩමට ප්‍රවේශයක් ලබාගන්න.
- අදාළ වාක්‍ය රටාව හඳුන්වා දී විවිධ දුර්ලභ ආහාර නම් කරමින් රසවිඳ බැලීමට කැමති දැයි ජපන් බසින් විමසා පිළිතුරු ලබාගන්න.
- විවිධ ජපන් ආහාර වර්ගවල පින්තූර පෙන්වමින් එම ආහාර පිළිබඳ විස්තර කරන්න.
- ජපන් ආහාරවල රූප පෙන්වමින් කුමන ජපන් ආහාර රස විඳ බැලීමට කැමති දැයි ශිෂ්‍යයන්ගෙන් විමසා පිළිතුරු ලබා ගන්න.
- කණ්ඩායම් වශයෙන් වෙන් කර, අවහන්හලකට ගොස් මෙනු පත් බලා ආහාර ඇනවුම් කරන ආකාරය පිළිබඳ සංවාද ගොඩ නගා පුහුණු වීමට උපදෙස් දෙන්න.
- ජපානයේ ආහාර රටාවන්, ක්‍රම සහ සිරිත් විරිත් පැහැදිලි කරමින් සාකච්ඡා කරන්න.

- දෙරටේ ආහාර වර්ග හා ආහාර ගැනීමේ දී පිළිපැදිය යුතු සිරිත් විරිත් පිළිබඳ ව සන්සන්දනාත්මක සාකච්ඡාවක් මෙහෙයවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත - 13 පාඩම සහ 27 පාඩම
- දේශීය- විදේශීය ආහාරවල පින්තූර /රූප
- මෙනු පතක ආකෘතියක්

**තක්සේරුව හා ඇගයීම**

- ජපානයේ ජනප්‍රිය ආහාර සහ ප්‍රධාන ආහාර නම් කර විස්තර කරයි.
- ජපන් ජාතිකයින් ආහාර ගැනීමේ දී පිළිපදින සිරිත් විරිත් ශ්‍රී ලාංකිකයින් සමග සසඳයි.
- සරල වාක්‍ය ඇසුරින් රසවිඳ බැලීමට කැමති ආහාර පිළිබඳ ව පවසයි.

**ඒකකය 17**

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියාකාරකම් පිළිබඳව ජපන් බසින් ප්‍රකාශ කරයි.

04 තම අවශ්‍යතා, ප්‍රියකරන දේවල්, දෛනික කටයුතු පිළිබඳ ව ලියයි.

**නිපුණතා මට්ටම**

2.1 තමා ව හඳුන්වා දෙයි.

4.1. සරල ජපන් බසින් තමා පිළිබඳ ව හැඳින්වීමක් ලියයි.

**කාලච්ඡේද 02යි.**

**ඉගෙනුම් පල**

- උචිත පසු යෙදුම් භාවිත කර පුද්ගලයින් සංඛ්‍යාත්මක ව ගණනය කරයි.
- තම පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව පවසා සාමාජිකයන්ව හඳුන්වා දෙයි.
- පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව සහ සාමාජිකයන් කවුරුන් ද යන්න අන්‍යයන්ගේ විමසා දැන ගනියි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ka zoku wa nannin desuka?
- kazoku wa ........... desu
- ga imasu යන වාක්‍ය රටා හඳුන්වා දීම
- පසු යෙදුම් භාවිත කරමින් පුද්ගලයන් සංඛ්‍යාත්මකව ගණනය කිරීම.
  උදා hitori, futari, san nin yo nin......
- පවුලේ සාමාජිකයන් හඳුන් වන පද /ආමන්ත්‍රණ විධි

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- දෙමාපියන් සහ පවුලේ සාමාජිකයින් සිටින පවුලක ඡායාරූපයක් හෝ රූප සටහනක් පෙන්වා පවුලේ සාමාජිකයින් වෙන වෙන ම ජපන් බසින් හඳුන්වා දෙන්න.
- රූප සටහනේ සිටින පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව උචිත පසු යෙදුම භාවිත කරමින් ගණන් කර පෙන්වන්න.
- අදාළ වාක්‍ය රටා හඳුන්වා දී අභ්‍යාස කරවන්න.
- තමාගේ පවුලේ සාමාජික සංඛ්‍යාව සහ සාමාජිකයන් පිළිබඳව පන්තිය ඉදිරියේ පැවසීමට උපදෙස් දෙන්න.
- සිසුන් කණ්ඩායම් කර යහළුවන් කිහිපදෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා කර ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් පිළිබඳ ව කෙටි විස්තරයක් සටහන් කර ගන්නා ලෙස උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළ පොත - 14 පාඩම
- පවුලක ඡායාරූපයක් / රූප සටහනක්

**තක්සේරුව හා ඇගයීම**

- තම පවුලේ සාමාජිකයන් පිළිබඳ ව කෙටි විස්තරයක් ලියයි.
- තම යහළුවන්ගේ පවුලේ සාමාජිකයන් පිළිබඳ ව වාචික ව විස්තර කරයි.
- සරල සංවාද ගොඩනගයි.

**ඒකකය 18**

**නිපුණතාව**

03 ප්‍රිය කරන දේවල් පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරමින් අන්‍යයන් සමග අදහස් හුවමාරු කර ගනියි.

08 ජපන් සමාජය හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

3.1. තමා ප්‍රිය කරන දේවල් පිළිබඳ ව ප්‍රකාශ කරයි.

8.1. ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන මවු බසින් අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 04 යි.**

**ඉගෙනුම් පල**

- තමන් ඉගෙනීමට  ප්‍රිය කරන විෂයයන් ජපන් බසින් ප්‍රකාශ කරයි.
- අන්‍යයන් ප්‍රිය කරන විෂයයන් විමසා දැන ගනියි.
- යමකට ඇති කැමැත්ත විවිධ ප්‍රකාශන ක්‍රම ඇසුරින් පැහැදිලි කරයි.
- ජපන් ජාතික ශිෂ්‍යයන්ගේ ප්‍රියතම විෂයයන් පිළිබඳ මව්බසින් හැඳින්වීමක් කරයි.
- ජපන් ජාතික ශිෂ්‍යයන් අධ්‍යාපනය පිළිබඳ ව දක්වන උනන්දුව සහ ඒ සඳහා ගත කරන කාලසීමාව, ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් සමග සසඳයි.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය සන්සන්දනය කරමින් මවුබසින් අදහස් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- Donna ------- ga sukid esuka?
  -----------ga suki desu.
  -----------to------------ ga suki desu.
  ---------- ya ------- ya ------- nado ga suki desu  යන වාක්‍ය රටා හඳුන්වා දීම
- ජපානයේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීම
  - ශිෂ්‍යයන්ගේ ප්‍රියතම විෂයයන්
  - අමතර පන්ති පිළිබඳ ව
  - විශ්ව විද්‍යාලයට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව
- කැමැත්ත / අකමැත්ත ප්‍රකාශ කරන විවිධ ප්‍රකාශ ක්‍රම
  - suki desu
  - suki dewa arimasen
  - dai suki desu
  - kirai desu
  - ma ma desu

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ශ්‍රේණියට අදාළ විෂයන් ලියන ලද හෝ විෂයන්ට අදාළ රූප සටහන් සහිත කාඩ්පත් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- අදාළ වක්‍ය රටාව භාවිත කරමින් කුමන විෂයයන්ට ප්‍රිය කරන්නේ ද යන්න ශිෂ්‍යයන්ගෙන් ජපන් බසින් විමසන්න.
- එක් විෂයයකට වඩා ප්‍රිය කරන අවස්ථාවල දී එය ප්‍රකාශ කරන ආකාරය දැක්වෙන වාක්‍ය රටා හඳුන්වා දී ශිෂ්‍යයන්ගේ අදහස් විවිධ අයුරින් ලබා ගන්න.
- ජපානයේ අධ්‍යාපන ක්‍රමය සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ ව පෙළ පොතේ කරුණු ඇසුරින් සාකච්ඡා කරන්න.
- වැඩිදුර තොරතුරු ගවේෂණය සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළ පොත - 15 පාඩම
- රූප කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- ඉගෙනීමට ප්‍රියකරන විෂයන් ජපන් බසින් නම් කරයි.
- ජපානයේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ තොරතුරු රැස් කරයි.
- දෙරටේ අධ්‍යාපන ක්‍රමයේ සමානතා අසමානතා සන්සන්දනය කරයි.

**ඒකකය 19**

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියාකාරකම් පිළිබඳ ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

08 ජපන් සමාජය හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි

**නිපුණතා මට්ටම**

2.3 තම දෛනික කාර්යයන් පිළිබඳ සරල ව ප්‍රකාශ කරයි

8.1. ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනාගෙන මව් බසින් අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 04 යි.**

**ඉගෙනුම් පල**

- තමා ආහාර වශයෙන් ගන්නා දේවල් පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- පන්තියේ මිතුරන් ආහාරයට ගන්නා දේවල් පිළිබඳ ව විමසා දැන ගනියි.
- ජපන් ජාතිකයින්ගේ දෛනික ආහාර, ආහාර පුරුදු, සිරිත් විරිත් හඳුනාගෙන ශ්‍රී ලංකාව සමග සසඳයි.
- සම වයසේ ජපන් ජාතික සිසුන් ප්‍රිය කරන ආහාර පිළිබඳ අවබෝධයක් ලබාගෙන මවු බසින් විස්තර කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ----nani o tabemasuka / nomimasuka ?
  ----o tabemesu/nomimasu යන වාක්‍ය රටා හඳුන්වා දීම.
- ජපන් ජාතිකයන්ගේ දෛනික ආහාර
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ ආහාර පුරුදු සහ සිරිත් විරිත් සන්සන්දනය කිරීම.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ශ්‍රී ලාංකිකයන් ආහාරයට ගන්නා විවිධ ආහාර සහිත පින්තූර/රූප සටහන් ශිෂ්‍යයන්ට පෙන්වමින් අදාළ වාක්‍ය රටාව ඇසුරින් වාක්‍ය ගොඩ නගමින් ශිෂ්‍යයන් ලවා එම වාක්‍ය නැවත කියවන්න.
- එක් එක් ශිෂ්‍යයා උදය ආහාරයට ගන්නේ මොනවා ද යන්න විමසමින් වාක්‍ය ගොඩනගා පිළිතුරු ලබා ගන්න.
- පන්තියේ ශිෂ්‍යයන් සංඛ්‍යාවට සමාන ව විවිධ ආහාර සහ බීම වර්ගවල නම් ලියූ පත්‍රිකා ශිෂ්‍යයන් අතරේ බෙදා දී දෛනික ආහාර පිළිබඳ ව එකිනෙකාගෙන් ප්‍රශ්න අසා පිළිතුරු ලබා ගෙන සටහන් කර ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සම වයසේ ජපන් ජාතික ශිෂ්‍යයන් ප්‍රිය කරන ආහාර, ආහාර පුරුදු සහ දෙරටේ ආහාර පුරුදු පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ජපන් ජාතිකයන්ගේ දෛනික ආහාර පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළ පොත - 16 පාඩම
- රූප කාඩ්පත් / පින්තූර

**තක්සේරුව හා ඇගයීම**

- තමා දෛනික ව ආහාර වශයෙන් ගන්නා දේවල් වාචික ව ප්‍රකාශ කරයි.
- තම වයසේ ජපන් ජාතික ශිෂ්‍යයන් ප්‍රිය කරන ආහාර සහ ආහාර පුරුදු තමන් සමග සසඳමින් විස්තර කරයි.

## ඒකකය 20

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියාකාරකම් පිළිබඳ ව ජපන් බසින් ප්‍රකාශ කරයි

**නිපුණතා මට්ටම**

2.3 තම දෛනික කාර්යයන් පිළිබඳ සරල ව ප්‍රකාශ කරයි

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- දෛනික ජීවිතයේ ප්‍රධාන ආහාර වේල් ලබා ගන්නා ස්ථාන පිළිබඳ ව පවසයි.
- අන්‍යයන්ගේ ආහාර පුරුදු පිළිබඳ ව විමසා දැන ගනියි.
- ජපන් ජාතිකයින් ආහාර ගැනීමට ප්‍රිය කරන ස්ථාන නම් කරයි.
- දෛනික ව ආහාර ගැනීමට පුරුදු වී ඇති ස්ථාන පිළිබඳ සරල සංවාද ගොඩනගයි
- ජපානයේ සම වයසේ ශිෂ්‍යයන් ආහාර ගන්නා ස්ථාන හඳුනාගෙන විස්තර කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- Itsu mo doko de --------o tabemesu ka?
  ------------de------o tabemesu යන වාක්‍ය රටා හඳුන්වා දීම
- ජපන් ජාතිකයන් ආහාර ගැනීමට ප්‍රිය කරන ස්ථාන හඳුනා ගැනීම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ජපන් ජාතික ශිෂ්‍යයන් ආහාර ගැනීමට පුරුදු වී ඇති ස්ථාන පිළිබඳ ව ද හැඳින්වීමක් කරමින්, පන්තියේ ශිෂ්‍යයන් උදය/දිවා/රාත්‍රි ආහාර ගැනීමට පුරුදු වී ඇති ස්ථාන කවරේදැයි ශිෂ්‍යයන් ගෙන් විමසා දැනගන්න.
- කළු ලෑල්ලේ වගුවක් පිළියෙල කර ශිෂ්‍යයන් කිහිප දෙනෙකුගේ නම් එහි සටහන් කර උදය/දිවා/රාත්‍රී/ ආහාර ලබා ගන්නා ස්ථාන සටහන් කරන්න.
- එම සටහන උපයෝගී කර ගෙන එක් එක් ශිෂ්‍යයන් නිතර ම ආහාර ගැනීමට පුරුදු වී ඇති ස්ථාන පිළිබඳ වාක්‍ය ගොඩ නගමින් ශිෂ්‍යයන් ලවා නැවත කියවන්න.
- ඊට අදාළ ප්‍රශ්න වාචී වාක්‍ය භාවිත කර ප්‍රශ්න කරමින් ශිෂ්‍යයන් ගෙන් පිළිතුරු ලබා ගන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර කෙටි සංවාද ගොඩ නගා පුහුණු වීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළ පොත - 17 පාඩම

**තක්සේරුව හා ඇගයීම**

- තමන් නිතර ආහාර ගැනීමට පුරුදු වී ඇති ස්ථාන පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- අන්‍යයන් ආහාර ගන්නා ස්ථාන දැන ගැනීම සඳහා කෙටි සංවාද ගොඩ නගයි.
- දෙරටේ සම වයසේ ශිෂ්‍යයන් ආහාර ගැනීමට පුරුදු වී ඇති ස්ථාන පිළිබඳ ව සසඳමින් අදහස් ප්‍රකාශ කරයි.

## ඒකකය 21

**නිපුණතාව**

03 ප්‍රිය කරන දේවල් පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරමින් අන්‍යයන් සමග අදහස් හුවමාරු කර ගනියි.

**නිපුණතා මට්ටම**

3.1 තමා ප්‍රිය කරන දේවල් පිළිබඳ ව ප්‍රකාශ කරයි

**කාලච්ඡේද 02 යි.**

**ඉගෙනුම් පල**

- ප්‍රිය කරන සතුන්, සුරතල් සතුන්ගේ නම් ජපන් බසින් කියයි, එම සතුන්ට ප්‍රිය කරන බව කියයි.
- මිතුරන් ප්‍රිය කරන සතුන් පිළිබඳ ව විමසා දැන ගනියි.
- විවිධ සතුන්ගේ හඬ ගෑම ජපන් බසින් අනුකරණය කරයි.
- රටවල් වලට අනුව සතුන්ගේ හඬගෑම ජපන් බසින් විවිධ ආකාරයෙන් හඳුන් වන බව පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- dobutsu ga suki desu ka ?

  donna dobutsu ga suki desuka.

  --------ga suki desu යන වාක්‍ය රටා හඳුන්වා දීම.
- විවිධ සතුන් ජපන් බසින් හඳුන්වා දීම.
- විවිධ සතුන්ගේ හඬගෑම ජපන් බසින් හඳුන්වා දීම.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- විවිධ සතුන්ගේ නම් පවසා ඔවුන් හඬ නගන ආකාරය අනුකරණය කර පෙන්වීමට ශිෂ්‍යයන් පවසන්න.
- එම හඬ ගෑමට අදාළ සතුන් ජපන් බසින් හඳුන්වන ආකාරය කළු ලෑල්ලේ සටහන් කරන්න.
- සංවාද ගොඩ නගා ශිෂ්‍යයන් පුහුණු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළ පොත - 18 පාඩම

**තක්සේරුව හා ඇගයීම**

- විවිධ සතුන්ගේ නම් ජපන් බසින් පවසා හඬ අනුකරණය කර පෙන්වයි.
- තමන් ප්‍රිය කරන සතුන් පිළිබඳ ව පවසයි.

## ඒකකය 22

**නිපුණතාව**

02 තමාට සමීප දේවල් සහ ක්‍රියාකාරකම් පිළිබඳව ජපන් බසින් ප්‍රකාශ කරයි.

04 තම අවශ්‍යතා, ප්‍රිය කරන දේවල්, දෛනික කටයුතු පිළිබඳ ව ලියයි.

**නිපුණතා මට්ටම**

2.3 තම දෛනික කාර්යයන් පිළිබඳ සරල ව ප්‍රකාශ කරයි

4.2 තම දෛනික ක්‍රියාකාරකම් සරල ජපන් බසින් ලියයි

**කාලච්ඡේද 04 යි.**

**ඉගෙනුම් පල**

- දෛනික ක්‍රියාකාරකම් සිදු කරන වෙලාව ප්‍රකාශ කරයි.
- දින චර්යාව සරල ව විස්තර කරයි.
- දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සටහන් කරයි.
- වෙනත් අයගේ දෛනික ක්‍රියාකාරකම් විමසා දැන ගනියි.
- සෙනසුරාදා සහ ඉරිදා වැනි නිවාඩු දිනවල සිදුකරන විශේෂිත ක්‍රියාකාරකම් විස්තර කරයි.
- සරල සංවාද ගොඩනගයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- විවිධ දෛනික ක්‍රියාකාරකම් විස්තර කිරීම
- ක්‍රියාපද ජපන් බසින් හඳුන්වාදීම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- උචිත ප්‍රවේශයක් ලබාගන්න
- දෛනික ක්‍රියාකාරකම් විස්තර කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාපද රූප කාඩ්පත් ඇසුරින් හඳුන්වා දෙන්න.
- එම ක්‍රියා පද සමග භාවිතා කරන නිපාත පද පිළිබඳ ව දැනුවත් කරන්න.
- දෛනික ක්‍රියාකාරකම් විස්තර කෙරෙන සරල වාක්‍ය ගොඩනගන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර, මිතුරන්ගේ දින චර්යාව සටහන් කර ගෙන එය වාචික ව ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- එක් එක් ශිෂ්‍යයන්ගේ දෛනික ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළ පොත - 19 පාඩම
- ක්‍රියා පද ලියන ලද කාඩ්පත්
- ක්‍රියාකාරකම් අඳින ලද රූප කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- දින චර්යාව විස්තර කරයි
- දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි සටහනක් ලියයි.

## තක්සේරුව හා ඇගයීම

**හැඳින්වීම**

පන්ති කාමරය තුළ ඵලදායී ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීම පිණිස ගුරු මහත්ම මහත්මීන් ශිෂ්‍යයන් ලබා සිටින ප්‍රාප්ති මට්ටම් සහ ඔවුන් මුහුණපා සිටින ඉගෙනුම් දුෂ්කරතා පිළිබඳ සුවිශේෂ ලෙස අවබෝධ කරගෙන සිටීම අත්‍යවශ්‍ය ය. එය එක් එක් ශිෂ්‍යයා හට ගැළපෙන ආකාරයේ ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීම පිණිස බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම පුළුල් අරමුණෙන් යුතු ව පන්ති කාමරය තුළ ශිෂ්‍යයන්ගේ ප්‍රගතිය පිළිබඳ නිරන්තරයෙන් තොරතුරු රැස්කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම යනුවෙන් සරල ව හැඳින්විය හැකි ය.

තක්සේරු කිරීමේ විවිධ භාවිතයන් ඇත. තේරීම් කාර්යය, ස්ථාපන කාර්යය, පර්යේෂණ කාර්යය ඒ අතරින් ප්‍රධානය. එහෙත් පන්ති කාමරය තුළ ගුරුවරයෙකුට ශිෂ්‍යයන්ගේ ඉගෙනීමේ ගැටලු අනාවරණය කරගෙන අපේක්ෂිත ඉගෙනුම් මට්ටම් කරා ශිෂ්‍යයන් නියාමනය කිරීම සඳහා අත්‍යවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීම පිණිස එය ප්‍රයෝජනවත් වේ. තක්සේරු කිරීම පන්ති කාමරය තුළ ක්‍රියාත්මක විය යුත්තේ එම පුළුල් අරමුණෙන් යුතුව ය.

පන්ති කාමරය තුළ කරනු ලබන තක්සේරු කිරීමේ ක්‍රියාවලිය දෙයාකාරයකට ක්‍රියාත්මක කළ හැකිය. එනම් සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනුම අඛණ්ඩ ලෙස සම්භවන ආකාරයට ක්‍රියාත්මක කිරීම සහ වසරක්, වාරයක්, පාඩම් ඒකකයක්, තේමාවක් ලෙස සම්පිණ්ඩිත ආකාරයට තක්සේරු කිරීමත් ය. මෙම ගුරු මාර්ගෝපදේශයේ සෑම ඒකකයක් අවසානයේ ම එම පාඩමින් ශිෂ්‍යයන් සංවර්ධනය කරගත යුතු කුසලතා සැලකිල්ලට ගෙන තක්සේරු කිරීමේ නිර්ණායක ඉදිරිපත් කර ඇත.

පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන අතරතුර මෙම ඉගෙනුම් මට්ටම් කරා ශිෂ්‍යයන් පැමිණ තිබේ ද?. නැතහොත් ඔවුන් දුෂ්කරතා පෙන්නුම් කරන්නේ ද? යන්න හඳුනා ගනිමින් කටයුතු කිරීමට ගුරුවරයෙකුට පුළුවන. මෙවැනි සම්භවන තක්සේරු කිරීමේ ක්‍රියාවලියකදී ගුරුවරයෙකුට ශිෂ්‍යයන් හඳුනා ගැනීම පිණිස, ශිෂ්‍යයන්ගේ වැඩ නිරීක්ෂණය කිරීම හා ශිෂ්‍යයන් සමග සාකච්ඡා කිරීම වැනි අවිධිමත් තක්සේරු කිරීමේ ක්‍රම භාවිතයට ගත හැකිය. එයට අමතරව කෙටි සටහනක් ලියවීම, පෙළපොතේ අභ්‍යාසවලට දෙන පිළිතුරු ඇගයීමට ලක්කිරීම වැනි ක්‍රමවේද ද භාවිතයට ගත හැකි ය. එසේම දෙවනුවට සඳහන් කළ සම්පිණ්ඩිත තක්සේරු කිරීම සඳහා මාසයක්, වාරයක්, අවුරුද්දක් අවසානයේ පවත්වන පරීක්ෂණ හෝ මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ඉදිරිපත් කොට ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරකය නිදර්ශකයක් ලෙස භාවිත කරමින් සකස් කරගන්නා ආධාරක යොදා ගත හැකි ය.

ශිෂ්‍යයන් තක්සේරු කිරීම සඳහා පරීක්ෂණ යොදාගන්නා විට තමා විසින් ම සකස් කරගනු ලබන පරීක්ෂණ උපයෝග කරගන්නේ නම් වඩාත් ඵලදායී වනු ඇත. පන්ති කාමරය තුළ කරන ශිෂ්‍ය ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස වඩාත් වලංගුතාවකින් යුක්ත වන්නේ අදාළ ගුරුවරුන් විසින් සකස් කර ගනු ලබන පරීක්ෂණය. ගුරු මහත්ම මහත්මීන් ඒ සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කර ගත යුතු ය.

මෙම පසුබිම යටතේ පන්ති කාමරය තුළ කෙරෙන ශිෂ්‍ය ප්‍රගතිය තක්සේරු කිරීම ශිෂ්‍යයන් හොඳින් හඳුනා ගෙන එක් එක් ශිෂ්‍යයාට ගැළපෙන ආකාරයේ ඉගෙනුම් අත්දැකීම් ලබා දී අපේක්ෂිත ඉගෙනුම් පල කරා ඔවුන් නියාමනය කිරීමේ මූලික පරමාර්ථය පෙරදැරි කර ගෙන ක්‍රියාත්මක විය යුතු ය.

එක් එක් නිපුණතා මට්ටම්වලට අදාළව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු අනුපිළිවෙළ සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ එක් ආධාරකයක් නිදර්ශකයක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ඉදිරිපත් කොට ඇත. එය අනුසාරයෙන් ඒ ඒ වාරවලට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක ගුරුවරයා විසින් ම උචිත පරිදි සකස් කර ගත යුතු ය.

## ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවර්ධනය කිරීමේ අධාරක

**පාසල් වාරයඃ** දෙවන වාරය

**නිපුණතා මට්ටම ඃ** 1.5, 1.6

**විෂය සන්ධාරයඃ**

- කතකනා අක්ෂර භාවිත කරන අවස්ථා හඳුනා ගැනීම.
- කතකනා අක්ෂර ලිවීම.
- කතකනා අක්ෂර භාවිත කර වචන ලිවීම.

**ආධාරකයේ ස්වභාවයඃ** පැවරුම - පොත් පිංචක් සකස් කිරීම.

**ආධාරකයේ අරමුණුඃ**

- කතකනා අක්ෂර භාවිත කළ යුතු අවස්ථා හඳුනා ගැනීම.
- විදේශිකයන්ගේ නම්, විදේශ රටවල සහ ප්‍රදේශවල නම් වල ජපන් උච්චාරණය අවබෝධ කර ගැනීම.
- දෛනික ජීවිතයට අවශ්‍ය, විදේශ භාෂාවලින් ජපන් භාෂාවට එකතු වූ වචන එක් රැස් කිරීම.
- කතකනා අක්ෂර භාවිත කර වචන ලිවීම.

**ආධාරකය ක්‍රියාත්මක කිරීමට උපදෙස්ඃ**

- කතකනා අක්ෂර භාවිත කළ යුතු එක් එක් අවස්ථා යටතේ වචන එක් රැස් කිරීමට උපදෙස් දෙන්න.
- කතකනා හෝඩිය හඳුන්වා දී අක්ෂර ලිවීමේ නිවැරදි පියවර අනුගමනය කරමින් අක්ෂර ලිවීම පුහුණු වීමට උපදෙස් ලබා දෙන්න.
- විදේශිකයන්ගේ නම්, විදේශ රටවල සහ නගරවල නම්, විදේශ භාෂාවලින් එකතු වූ වචන යන මාතෘකා යටතේ පිටු කිහිපය බැගින් වෙන් කර පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න.
- පහත ආකෘතියට අනුව එක් එක් මාතෘකා යටතේ වගුවක් පිළියෙල කර එක් රැස් කර ගත් වචන කතකනා අක්ෂර භාවිතයෙන් ලිවීමටත් අවශ්‍ය අවස්ථාවල දී අර්ථය ලිවීමටත් උපදෙස් දෙන්න.

| වචන | අර්ථය |
|---|---|
| | |

- පොත් පිංච සකස් කිරීමට නියමිත කාල සීමාවක් ලබා දී පහත සඳහන් නිර්ණායක යටතේ ඇගයීමට ලක් කරන්න.

**ඇගයීමේ නිර්ණායක**

| නිර්ණායක / ශිෂ්‍යයන්ගේ නම | අක්ෂර නිවැරදි ව ලිවීමේ හැකියාව | වචන ලිවීමේ හැකියාව | අක්ෂර වල පැහැදිලි බව | ජපන් භාෂාවේ උච්චාරණයට අනුව උච්චාරණය කිරීම | එකතු ව |
|---|---|---|---|---|---|
| | | | | | |

**ලකුණු පරාසය**

ඉතා හොඳයි - 04
හොඳයි - 03
මධ්‍යස්ථයි - 02
සංවර්ධනය විය යුතුයි - 01